# සුබසෙත

සත චෙත සිරිසෙත සලසන සත්පත

ශක වර්ෂ 1945 ක් වූ
මේෂ රවි 08 භාග වෙසක් පුර පෑළවිය
තිථිය ලත් කිවි දින

54 වැනි කාණ්ඩය
46 වැනි පත්‍රය
ආරම්භය 1969 - 05 - 28

වෂී 2023 අප්‍රේල් 21 සිකුරාද subasetha@lakehouse.lk SUBASETHA, FRIDAY, APRIL 21 2023


## හෙට සිදුවන ගුරු මාරුව රටට යහපත්ද?

2023 අප්‍රේල් 22 ශනි දින අලුයම 5.13ට ගුරු හෙවත් බ්‍රහස්පති මේෂ රාශියට පිවිසෙයි. අස්විද, බෙරණ සහ කැති නැකැතේ පළමු පාදය පසු කරමින් 2024 මැයි 01 දක්වා මේෂ රාශියේ ගමන් කරයි.

ගුරු සූර්යයාට පමණක් කුඩා වන අතර, නැකැත් තරුවලට පිටින් ගමන් කරයි. රශ්මිය පැවැත්වීමේදී ද ඉරුට පමණක් දෙවැනි වේ. ප්‍රමාණයෙන් පෘථිවිය මෙන් එක්දහස් තුන්සිය වාරයක් විශාල වේ. ගුරු උසට වඩා මහත ඇති ග්‍රහයෙකි. එනිසා ගුරු ලග්නයේ සිටින විට උපදින අය බොහෝ මහත් වේ. හැම දෙයක්ම පතුරවන විශාල කරවන ග්‍රහයා ගුරු වෙයි. පුරාතනයේ සිටම ගුරු ග්‍රහයා "ගුරු" නමින් හඳුන්වයි. මිනිසාගේ දියුණුවට උසස් වීමට සියලු යහපත් දේට ගුරු බලවත් වෙයි. ගුරු කටක රාශියේ සිටියදී උපන් අය ඉහළම දියුණු තත්ත්වයට පත් කරයි. ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ කටක ලග්නයේ ගුරුය.

අනුකම්පාව, සෞම්‍ය ගතිය මෙන්ම ඥානය, විශ්වාසවන්ත බව ගුරුගෙන් ලැබෙන දේවල්ය. නීති ගරුක බව, උසස් ඉගෙනීම් වාසනාව, නීරෝගිකම, වැඩිහිටියන්ට ගරු කිරීම, ධනය, ප්‍රසිද්ධිය ලැබීමද ගුරු නිසා ඇති වෙයි. පුත්‍රකාරක මෙන්ම ධනකාරකද වෙයි. ආගමික ස්ථාන විද්‍යා ස්ථාන භාණ්ඩාරවලට අධිපති වෙයි. ගුරු දෙවැන්නේ සිටි විට ඥාන යෝග උදා කරයි. චන්ද්‍රයාට දෙළහේ බුධද චන්ද්‍රයාට දෙවැන්නේ ගුරුද යෙදුන විට ඥාන යෝග වේ. බුධ විසින් ගුරු දැකීමද ඥාන යෝගයකි.

ශරීරයේ මහත්වන ගතියට කැමැත්ත මස්පිඬු පෙණහැල්ලේ ජලය රැඳීම රක්ත ධාවනයට ගුරු අධිපති වෙයි. ගුරු නරක් වීමෙන් ඕනෑවට වඩා මහත්වීම, ලේ විෂ වීම, මොලේ තදවීම, පෙණහලු රෝග, විදුරුමස් දියවීම, පීනස, සෙංගමාලය, දියවැඩියාව, සන්නිපාත උණ ආදිය ඇතිවේ.

අශ්වයන්ට, ගොනුන්ට, ඇතුන්ට, මුවන්ට සහ ගෘහවාසී සතුන්ටද අධිපති වේ. මොණර ආදි ලස්සන කුරුල්ලන්ටද අධිපති වන අතර, කොස් වැනි අරටුව ඇති පලදරන වටිනා ගස් වලටද අධිපති වේ. ධනු-මීන රාශි ගුරුට අයත්වන අතර, කටක රාශියේ දී උච්ච වේ. මකර රාශියේදී නීච වේ. කටක, ධනු, මීන රාශිවල කේන්ද්‍රගතව හෝ ත්‍රිකෝණගතව සිටි විට හංස යෝගය නම් පංච මහා පුරුෂ යෝගය උදා කරයි. කේන්ද්‍රස්ථාන ත්‍රිකෝණ නොවී, ගුරු, කටක රාශියේ සිටි විට ජය සිඳු යෝගයද ධනු වේදී ගුරුහංස යෝගයද මීනයේදී භූමිඵල යෝගයද උදා කරයි. ගුරු මාරුව රටට යහපත් වේ.

යහපත් ලෙස වැසි පල ලැබේ. ජනතාවට යහපත සෙත ශාන්තිය උදාවේ. ආහාරපාන සුලභ වේ.

ධනු – මීන ලග්න දෙකට ඉතාමත්ම සුබයි. ජයග්‍රහණද අත්වේ. මේෂ, මිථුන, මකරවලටද සුබයි. ඉතිරි ලග්නවලට සමපලදායක වේ.

ගුරු මාරුව ලග්නවලට බලපාන අයුරු

**මේෂ** – මේෂයේ නවවැන්න සහ දොළොස්වැන්න අධිපති ගුරු ලග්නයට පැමිණීම සුබයි. දිග් බලයෙන් යුතුව ලග්නයේ ගමන් කරන ගුරු සියලු දෝෂ භංග කර යහපත උදාකරයි. භාග්‍යස්ථානය අධිපති ගුරු උසස් අධ්‍යාපනය, රැකියාව, ධනය, බලය ආදී සිය ජීවිතයේ වැදගත් කරුණු බොහොමයක් සාර්ථක කරන බව පෙන්වයි. තම සිත තුළද අනුකම්පාව, දයාව, කරුණාව යහපත් සිතුවිලි ඇති කරයි. හිතවත්කම් වර්ධනය කරගෙන අන් අයගෙන් උදව් උපකාරද ඉතා පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ඇති කරයි. ලෙඩ රෝග අනතුරු පීඩාවලින් ආරක්ෂා වෙයි. ඉතා හොඳින් නිවැරැදි ලෙස කටයුතු කළ හැක. පරාර්ථකාමී ගති නිසා හිම්හිට දියුණුව ඇති වේ. දියුණුවට අවහිර කරන අයද ඇතිවේ. සෙමි අමාරු හිසේ අමාරු ඇති කරයි. නිෂ්ඵල ගමන් බිමන්ද යෙදිය හැක. ණය වීම සහ නඩු හබ ඇති කර ගැනීම සුදුසු නොවේ. දියුණුවට අවහිරකම් කරන අයගෙන් ප්‍රවේශම් විය යුතුය. බෝධි පූජා පැවැත්වීම සුබයි.

**වෘෂභ**

වෘෂභ ලග්නයේ අට සහ එකොළොස් වැනි අධිපති ගුරු දොළොස්වැන්නට පැමිණෙයි. අට අධිපතියා, දොළහේ යෙදීමෙන් 'සරලා' යෝගයද යෙදෙයි. සතුරු කරදර මර්දනය කරමින් කටයුතු කළ හැක. ආගමික මෙන්ම ආධ්‍යාත්මික අංශවලටද සිත යොමු විය හැක. සුළු දේවල් ලොකුවට සිතීම නිසා හිතට කරදර ඇතිවේ. පවුලේ අය සමඟ සම්බන්ධය අඩුවීමට ඉඩ තිබේ. වියදම් වැඩිවේ. ආර්ථික අපහසුතා ඇතිවීමට ඉඩ තිබේ. ගමන්බිමන් වලින් නඩුහබවලින් වැළකී සිටීම යහපත් වේ. සහකරු හෝ සහකාරියට රෝග පීඩා යෙදිය හැක. බෝධි පූජා පවත්වා ශක්‍ර දෙවියන්ට පින් දීම සුබය.


කලාභූෂණ ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී
සෝමපාල විජේසූරිය


2 පිටුව

## සියලු සුබ වැඩට බලවත් ත්‍රිපුෂ්කර යෝග බලැති නැකැතක්

කැති, උත්‍රපල්, උත්‍රසල, පුනාවස, විසා, පුවපුටුප යන නැකැතකුත් සහ 2,7,12 යන තිථියකුත්, කුජ,ශනි, රිවි යන දිනයකුත් සම්බන්ධ වීමෙන් ඉතා දුර්ලභ බලගතු ත්‍රිපුෂ්කර යෝග බලය උදාකෙරෙයි. මෙකී යෝග බලය පවත්නා කාලය තුළදී මුහුර්තයේ ගුණ තෙගුණයක් වන්නේය. 2023 අප්‍රේල් මස 22 වැනි ශනි දින පෙරවරු 6.05ට හා 6.53ට මෙකී යෝග බලය පවතින්නේය.

මෙකී යෝග බලය පවතින අවස්ථාවේ නිවාස, වෙළෙඳ ව්‍යාපාරමය කාර්යයන් සමාරම්භයට, නිවාස, ඉඩකඩම්, යානවාහන මිලදී ගැනීමටත්, තරඟ විභාග, රැකිරක්ෂා සඳහා ඉදිරිපත්වීමටත්, මැණික් ගැරීම, නව වස්ත්‍රාභරණ පැළැඳ ගැනීමටත්, අකුරු කියවීමට, ඉඳුල් කටගෑමට සහ ආගමික, සමාජසේවා කාර්යයන් ආරම්භයටත් ඉතාම යහපත් වන්නේය.


ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී කොත්මලේ
නාරද ඩී. ලියනආරච්චි



1 වැනි පිටුවෙන්...

# හෙට ගුරු මාරුවෙයි

### මිථුන

මිථුන ලග්නයේ හත්වැන්න සහ දසවැන්න හෙවත් කර්මස්ථානය හිමි ගුරු අයස්ථානයට පැමිණෙයි. ධනය, බලය මෙන්ම උරුම හිමිකම්ද ලැබේ. අවිවාහක අයට මංගල යෝගද උදාවේ. මහන්සියෙන් තොරව ආදායම් ලැබිය හැක. පවුලේ අය සමඟ කරන කටයුතුවලින් දියුණුව ඇති කරයි. දේපළ උරුම හිමිකම්ද ලැබේ. කල්‍යාණ මිත්‍රයන්ගේ දියුණුව යහපත් ලෙස ආධාර උපකාර ලැබේ. නිදහස් ව්‍යාපාර කටයුතුද සාර්ථක ලෙස දියුණු කර ගත හැක. මංගල කටයුතු වලදී දැනුමින්, බුද්ධියෙන් මෙන්ම ධනයෙන් යුතු වැදගත් සහකාරියක් ලැබිය හැක.

### කටක

ලග්නයේ හයවැන්න සහ නවවැන්න අධිපති ගුරු දසවැන්නට පැමිණෙයි. එතරම් අසුබ නැත. කරන කියන රැකියා කටයුතුවලට සුබපල ඇති කරයි. උසස් අය සමඟ එක්ව කටයුතු කිරීමට අවස්ථාව ලැබේ. මංගල කටයුතු උදාවේ. රැකියාවලට සතුරු කරදරවල බලපෑම්ද ඇති වුවත් ඒවා මර්දනය කර ගැනීමට ශක්තිය හා බලය පවතී. ගේ දොර දියුණුව ඇතිවේ. ප්‍රධානත්වයක් ලැබීමටද වාසනාව උදාවන බව පෙනී යයි. දෙස් නොඅසන ලෙස කටයුතු කිරීමට හැකියාව උදාවේ. ප්‍රසිද්ධියද ඇතිවේ.

### සිංහ

සිංහ ලග්නයේ පස්වැන්න සහ අටවැන්න හිමි ගුරු නව වැන්නට පැමිණෙයි. බාධා මධ්‍යයේ සිය කටයුතු සාර්ථක කර ගැනීමට සිදුවිය හැක. උරුම හිමිකම් ලැබීමේ භාග්‍ය උදාවේ. ඉගෙනීම් කටයුතුවල නිරත අය උනන්දුවෙන් කටයුතු කළ යුතුය. රැවටීම් මුලාවීම්වලින් වැළකිය යුතුය. බලාපොරොත්තු නොවූ ලෙස යම් යම් අවස්ථාවලදී නොසිතූ ලෙස තමා කරන කියන කටයුතු සාර්ථක වීමටද ඉඩ තිබේ. වැඩිහිටියන් සමඟ තිබෙන සම්බන්ධය අඩු වීමටද ඉඩ තිබේ.

### කන්‍යා

කන්‍යා ලග්නයේ හතරවැන්න සහ හත්වැන්න අධිපති ගුරු අටවැන්නට පැමිණෙයි. කේන්ද්‍රයක තුන හය, අට ගුරුට අසුබ ස්ථාන වෙයි. ඒ අනුව කරදර බාධා අසහන ඇති කරයි. ඉඩකඩම් දේපළවල පළ ප්‍රයෝජන , ලැබීම් අඩුවීමට ඉඩ තිබේ. රහස්‍ය කටයුතුවලට දක්ෂතා ඇතිවේ. වකුගඩු ආශ්‍රිත උෂ්ණ රෝග පීඩා යෙදීමට ඉඩ තිබේ. ශරීර සනීපය දුර්වල විය හැකි අතර, මානසික පීඩාද යෙදිය හැක. සීමාව ඉක්මවා හොඳ හෝ නරක දේවල්වලට ඇබ්බැහි වීමටද ඉඩ තිබේ. හවුලේ කරන කටයුතුවලින් පාඩු ඇතිවීමටද ඉඩ තිබේ. බෝධි පූජා තුනක් පවත්වන්න.

### තුලා

තුලා ලග්නයේ තුන්වැන්න සහ හයවැන්න අධිපති ගුරු හත්වැන්නට පැමිණෙයි. තුලාවට ගුරු එතරම් සුබ ග්‍රහයෙක් නොවේ. මධ්‍යස්ථ ප්‍රතිඵල ලැබේ. වගකීම් සහගතව කටයුතු කිරීමට මෙන්ම වගකීම් භාර ගැනීමටද යහපත් වේ. එම කටයුතු යහපත් ලෙස කළ හැක. විශ්වාසවන්තව කටයුතු කළ හැක. හිතවත් අයගෙන් ඇසුරු කරන අයගෙන් උදව් උපකාර ලැබිය හැකි අතර, හවුලේ කරන කටයුතුවලින්ද සෑහෙන දුරට ප්‍රතිඵල ලැබිය හැකි වේ. සහකරුට හෝ සහකාරියට රෝග පීඩා ඇති විය හැක. විරුද්ධවාදිකම්වලට මුහුණ පෑමට සිදු විය හැක. සහෝදරයන් සමඟ කිට්ටු ආශ්‍රය අඩු විය හැක. මුත්‍රා ආශ්‍රිත හෝ උදරගත රෝග පීඩා යෙදිය හැක.

### වෘශ්චික

වෘශ්චික රාශියේ දෙවැන්න සහ පස්වැන්න අධිපති ගුරු හයවැන්නට පැමිණෙයි. හයවැන්න සතුරු සහ රෝගස්ථානයයි. එතරම් සුබ නැත. උදරගත උෂ්ණරෝග පීඩා පිත් අමාරු, ඇස් වල අමාරු ඇතිවීමට ඉඩ තිබේ. වියදම වැඩි වීමටද සතුරු කරදර ඇතිවීමටද ඉඩ තිබේ. කතාව නිසා සතුරු කරදර යෙදීමටද හැකියාව පවතී. දරුවන් සතුරු වීමටද ඉඩ තිබේ. ඉගෙන ගන්නා අයගේ ඉගෙනීම්වලට බාධා ඇති විය හැක. උපතේදී කුජ බලවත්ව සිටී නම් අපල අඩුවේ. සතුරන් නිසා ධනය වියදම් වීමටත් ධනය ලැබීමටත් ඉඩ තිබේ.

### ධනු

ධනු ලග්නයේ ලග්නාධිපති සහ හතරවැන්න අධිපති ගුරුය. එම ගුරු පස්වැන්නට පැමිණෙයි. එය සුබයි. ගුරු ත්‍රිකෝණගතය. ඕනෑම දෙයක් කිරීමට හැකියාව ඇතිවේ. දැනුම, බුද්ධිය යොදවා කරන කටයුතු ඉතාමත් සාර්ථක වේ. ගමන් බිමන්ද යෙදේ. ඥාතීන් සමඟ සුහදව කටයුතු කළ හැක. වෙළඳ ආදී ව්‍යාපාර කටයුතුවලටද සුබයි. හිතට සතුට, සහනය ලැබේ. සතුරු කරදර රෝග පීඩා අඩුය. ඉගෙනීම් වලටද ඉතා යහපත්ය. ඉතිහාස අංශයෙන් දැනුම ලබාගැනීමටද කැමැත්ත ඇතිවේ.

### මකර

මකර ලග්නයේ දොළොස්වැන්න සහ තුන්වැන්න අධිපති ගුරු හතර වැන්නට පැමිණෙයි. හොඳ අත්ගුණයකින් යුතුව වැඩකටයුතු ආරම්භ කිරීමට ශක්තිය ධෛර්ය ලැබේ. පදිංචි ස්ථානය පලදෙන අතර, අලංකාර දියුණුවද ඇති කරයි. ඉගෙනීමේ නියුතු අයටද ඉතා සුබයි. ආගමික අංශවලටද ලැදිවේ. ඉඩකඩම් වගා කටයුතු වැවිලි අංශවල රැකියා ආදියද දියුණුවට පත්වේ. ගමන් බිමන් නිසා විවේකය අඩුවීමට ඉඩ තිබේ. දේපළ පිළිබඳ නඩුහබ ඇතිවීමටද ඉඩ තිබේ.

### කුම්භ

කුම්භ ලග්නයේ දෙවැන්න සහ එකොළොස්වැන්න අධිපති ගුරු තුන්වැන්නට පැමිණෙයි. තුන්වැන්න ගුරුට අසුබම ස්ථානයක් වෙයි. ශරීර සනීපයට බාධා ඇති කරයි. උෂ්ණ රෝග පීඩා නිසා කරදර බාධා ඇතිවිය හැක. ධනය මෙන්ම උරුම හිමිකම් ලැබීමට ඉඩ ඇතත් ඒවායින් ඵල ප්‍රයෝජන ලැබීම අසීරු තත්වයට පත්වීමට ඉඩ තිබේ. මසුරුකම්ද ඇතිවේ. අනතුරු පීඩා බහුලයි. ක්‍රමානුකූලව කටයුතු කර අවහිරයකින් තොරව ආදායම් ලැබීමටද මං පෙත් විවර වෙයි. සමාජයටද හිතවත් වේ. කන්වල අමාරු ඇතිවීමටද ඉඩ තිබේ.

### මීන

ලග්නාධිපති සහ කර්මස්ථානය වන දසවැනි අධිපති ගුරු දෙවැන්නට පැමිණෙයි. දෙවැන්න ධනස්ථානයයි. කර්මස්ථාන අධිපති ධනස්ථානගතවීම ඉතා සුබයි. කරන හැම දෙයකින්ම සාර්ථක ප්‍රතිඵල ලැබිය හැක. පලදීම යහපත්ය. රැකියා කටයුතු දියුණුවේ. රැකියා මාරු වුවත් වෙනස් වුවත් එය දියුණුවට ඉතා සුබදායක වේ. සාධාරණ ලෙස කටයුතු කරයි. බිය සැක නැතිව කටයුතු කළ හැක. වුවමනා වූවිට කෙසේ හෝ මුදල් ලැබේ. උගුරේ සෙම් දෝෂ පීඩා යෙදිය හැක.

ලග්නය 10

# දසවැනි භාවය

ජන්ම කේන්දරයේ දහවැනි කොටුව හෙවත් දහවැනි භාවය කර්මස්ථානය, අභිමානස්ථානය, පීතෘ ස්ථානය යන නම්වලින් හඳුන්වයි. රැකියාව පිළිබඳව ප්‍රධාන වශයෙන් දහයෙන් බැලිය හැකි වේ. රාජ්‍ය සේවය, වෙළඳම, කෘෂිකර්ම කටයුතු, ප්‍රසිද්ධිය, ආගමික කටයුතු, පොදුජන සේවය වැනි දේවල් පිළිබඳව දහයෙන් බැලිය හැකි වේ.

දහවැන්න හෙවත් දහ වැනි භාවයෙන් ප්‍රධාන වශයෙන් වෘත්තිය හෙවත් රැකී රක්ෂාව පිළිබඳව බැලිය හැකි වේ. ජන්ම කේන්දරයේ දහවැන්න වෘත්තිය ගැන කියවෙන රාශිය වේ. දහ වැන්නේ සිටි ග්‍රහයා ශුභ ග්‍රහයකු වූ විට රැකියාව හොඳ වේ. දහවැන්නේ අශුභ ග්‍රහයන් සිටි විට හා දහ වැන්න පාපකර්තරී වීම රැකියාව සම්බන්ධව ප්‍රශ්න මතුවේ. දහවැන්නේ සිටින ග්‍රහයා අනුවත් දහවැන්න අධිපති ග්‍රහයා සිටින තැන අනුවත් රැකියා තත්ත්වයන් තීරණය වේ.

රැකියා පත්වීම් ලැබීම එහි උසස් වීම සම්බන්ධව දහයෙන් බැලිය හැකි වේ.

දහවැන්න පීතෘ ස්ථානය යන නමින් ද හැඳින්වේ. පියා සම්බන්ධ කරුණු පියාගේ ධනය පිළිබඳව දහයෙන් බලාගත හැකි වේ.

හත්වැන්නෙන් හතරවැන්න දහ වැන්න වන බැවින් සහකරු හෝ සහකාරියගේ ගේ දොර ඉඩකඩම් යාන වාහන පිළිබඳ ව ද හවුල් ව්‍යාපාරවල හවුල්කරුවන්ගේ ගේ දොර ඉඩකඩම් යාන වාහන පිළිබඳව ද දහ වැන්නෙන් බැලිය හැකි වේ.

පස්වැන්නෙන් හයවැන්න දහ වැන්න වන බැවින් තම දූ දරුවන්ගේ ලෙඩ රෝග පිළිබඳව ද තුන්වැන්නෙන් අටවැන්න දහ වැන්න වන බැවින් තම සහෝදරයාගේ හා සහෝදරියගේ ආයුෂ තත්ත්වය පිළිබඳව ද බැලිය හැකි වේ.

එකොළොස්වැන්නෙන් දොළොස්වැන්න දහ වැන්න වන බැවින් තම වැඩිමහල් සහෝදරයාගේ වියදම, ධන විනාශය තම යහළු මිත්‍රයන් ගේ ධන විනාශය, රහස් කටයුතු නීතිමය කරදර ගැන බැලිය හැකි වේ.

ජන්මියාගේ ප්‍රසිද්ධිය රටේ නම කීර්තිනාමය බැබළීම ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීම පිළිබඳවද අධ්‍යාපනික කටයුතු පිළිබඳවද පොදුජන සේවය පිළිබඳව ද දහයෙන් බැලිය හැකි වේ. ශරීරය දණහිස කොඳු ඇටය දහයට අයිති වන ශාරීරික අවයව වේ. රවි ග්‍රහයා දහ වැන්නට ඉතා බලවත් වේ. සියලුම ලෞකික සැප සම්පත් නම්බුනාම ප්‍රසිද්ධිය, උසස් තනතුරු ලැබේ. සඳු ග්‍රහයා දහයේ සිටි විට යහපත් රැකියා වෙළෙඳ ව්‍යාපාර ආදිය කිරීමට හැකිවේ. ඇවිදිලි සහිත රැකියා සඳහා ඉතා යහපත් වේ. කුජ දහයේ සිටි විට ආඩම්බර වේ. ක්‍රියා ශූරත්වය ඇති අයෙක් වෙයි. කුජ බලවත්ව සිටියොත් ඉතා උසස් තත්ත්වයට පත්වේ. බුධ ග්‍රහයා දහයට ඉතා යහපත් වේ. තැනට උචිත ලෙස වැඩ කරයි. ව්‍යාපාරවලින් ඉහළටම යා හැකි වේ. කීර්තිමත් තනතුරු ලබයි. ගුරු ග්‍රහයාද දහයට ශුභ වේ. ස්ථිර රැකියාවක් හිමි වේ. උසස් තනතුරු හිමි වේ. රැකියා ස්ථානයේ ප්‍රධානියා වීමට ද ඉඩ තිබේ. සිකුරු ග්‍රහයාද දහයට ශුභ වේ. උසස් අයගෙන් උදව් උපකාර ලැබේ.

යහපත් ගතිගුණ ඇති අයෙක් වේ. රජයේ රැකියා ද හිමි වේ. ශනි ග්‍රහයා දහයට එතරම් සුබ නොවේ. රැකියා ප්‍රශ්න මතුවේ. ව්‍යාපාරවලින් පාඩු සිදුවිය හැකි වේ. ශනි දහයේ සිටි විට බොහෝ ප්‍රසිද්ධ වේ. දේශපාලන කටයුතුවලට සුබවේ. කේතු ග්‍රහයා දහයට එතරම් සුබ නොවේ. රෝග ඇති කරයි

චතුරිකා දිල්හානි ගමආරිය

# ඉඳුල් කට ගෑමේ චාරිත්‍රය

ඔන්න අදත් ඔයාලාට වටිනා ලිපියක් රැගෙනයි ආවේ. විශේෂයෙන්ම දරු සුරතල් බලන මවට පියාට දරුවා ඉපදිලා මාස 06ක් පමණ ඉක්මයාමත් සමඟ දරුවාට ඉඳුල් කට ගෑමේ අවස්ථාව උදාවෙනවා. මේ සුබ කටයුත්ත කෙසේද කොහොමද සිදුකරන්නෙ කියන කාරණාව ගැන හරියටම ඔබව දැනුම්වත් කරමින් කතා කරන්නයි අද සූදානම් වෙන්නේ.

මේ පිළිබඳ කටුයුතු කළ අන්දම ඈත අතීතයේ හෙළ මහා තාක්ෂණ අවධිය දක්වා දිව යනවා. එනම් මහා රාවනා රජ දවසත් එතැනින් ඔබ්බට මෙම චාරිත්‍රය දිවයනවා. එකල සූර්යයා වන්දනා මාන කරන ඉතාමත් අභිමානවත් කාල සීමාවක්. විශේෂයෙන්ම මෙම සුබ කර්තව්‍යය එකල සූර්යයා නැග එමත් සමඟම ඉතාමත් උත්සවාකාරව සිදු වූවා. එය කෙමෙන් කෙමෙන් විකාශනය වී අද එය 'හත්ති පාරිභෝග මංගල්‍යය ' ලෙස විකාශනය වී තිබෙනවා.

මෙහිදී ජන්මියාට ලුණු මිරිස් දෙහි ඇඹුල් හා කුලුබඩු මිශ්‍ර කර පිසින ව්‍යාංජන සමඟ බත් ප්‍රථම වරට අනුභවය සිදුකරනු ලබනවා. දරුවා උපන් දා සිට මාස 06ක් යන තුරු මව්කිරෙන් හා දියරමය ආහාර මඟින් පෝෂණය වී ඉන් පසු ඝන ආහාරවලට හැඩ ගැසිය යුතුයි. දරුවා කෙමෙන් කෙමෙන් වර්ධනය වන විට යම් යම් දෙවල් අතට අහු වෙයි. ඒවා කටේ දා ගැනීමට උත්සාහ කරයි. එයට පෙර මෙම ඉඳුල් කටගෑමේ චාරිත්‍රය සිදු කිරීම වැදගත් වෙනවා. විශේෂයෙන්ම පිරිමි දරුවකු නම් මාස 06, 08, 10, 12 යන කාල වලදීද, ගැහැනු දරුවකු නම් මාස 07,09, 11 යනාදී මාස වලද මෙම මංගල කටයුත්ත සිදු කළ යුතුයි.

මෙහිදී නැකත් තෝරා ගැනීමේදී පුෂ, අනුර, උත්‍රපුටුප, පුනාවාස, සා, සියාවාස, මුවසිරස, සිත, දෙනට, හත, රෙහෙණ, උත්‍රපල් ආදි නැකත් තෝරා ගැනීම ඉතාම සුබ වෙනවා.

මෙහිදී දරුවාගේ උපන් නැකතට අනුව ඉහත කී නැකත් ගණනය කර එය ජන්ම, සම්පත්, මෛත්‍රී, පරම මෛත්‍රී වගේම සාධක නැකතකට එන ලෙස සාදා ගත යුතුයි. එමෙන්ම මෙය සාදා ගන්නාවිට පුර පසොළොස්වක, අමාවක යන දිනයන් බැහැර කළ යුතුයි.

එලෙසම දරුවා උපන් ලග්නයෙන් 08 වන රාශිය අත්හැර දැමීමට ජෝතිර්වේදියා වග බලා ගත යුතුයි.

අනිවාර්යයෙන්ම නැකත සාදා ගන්නාවිට එම වේලාවට අදාළ තත්කාල කේන්ද්‍රය සාදා ගත යුතුය. එසේ සාදා ගන්නාවිට වෘෂභ, සිංහ, කුම්භ යන ලග්නයන් ඉතා සුබයි. ඒවගේම මේෂ, වෘශ්චික හා මීන යන තත්කාල කේන්ද්‍රයන් බැහැර කළ යුතුයි.

එලෙසම මෙම සියලු කටයුතු අවසානයේ එදිනට යෙදී ඇති තිථියද වැදගත් වේ. එයද බැලීම කළ යුතුය. එහිදී පුර පක්ෂයේ තිථි පමණක් භාවිතා කළ යුතුයි. පුර පක්ෂයේ තිථි 15 අතරින් පෑලවිය, දියවක, තියවක, සතවක, දසවක, එකොලොස්වක, විසේනිය, තෙළෙස්වක යන තිථි ඉතාම සුබයි.

මෙම නැකතට පෙර දින තමන් අදහන ආගමානුකූලව කටයුතු කර ආශිර්වාදය ලබා ගත යුතු වෙනවා. විශේෂයෙන්ම පන්සලකට ගොස් මල් පහන් පුජා කර ආශිර්වාද ලබාගෙන දාගැබකට වන්දනා මාන කර පැන් කල 07ක් හෝ 09 කින් බෝධීන් වහන්සේ දෝවනය කර ආශිර්වාදය ලබා ගැනීම කළ යුතුයි.

ඇල් හාලේ බත්, කිරි හොදි, කැවුම් කෙසෙල් ආදිය ද කෙසෙල් කොළයක අතුරා, පැඳුරක් මත තබා අදාළ ජෝතිෂවේදියා ලබා දෙන නැකතට දිසාවට අනුව පහන් පත්තු කර අදාළ චාරිත්‍රය කිරීම සුබදායක වෙයි. එහිදී මුහුණ බලන කණ්නාඩියක්,සෙල්ලම් බඩු, පොත් පෑන් පැන්සල් ආදිය තැබීම කළ යුතුය. පුතෙක් නම් මව විසින්ද, දුවක් නම් පියා විසින්ද අදාළ මංගල කටයුත්ත කරනවා නම් ඉතාම සුබයි.

ඉන් පසුව දරුවාට අදාළ ද්‍රව්‍යවලින් කැමති දෙයක් තෝරා ගැනීමට ඉඩ සලස්වා එයින් දරුවාගේ අනාගතය කෙසේද යන වග මැන බැලීමට හැකි බව චාරිත්‍රානුකූලව පැරණි මතයක්ද ඇත.

ජ්‍යෝතිෂවේදී මාවනැල්ලේ

**සශේනක දිලාන් බණ්ඩාර**

# සතුරු කරදර මුලින් හඳුනාගන්න

පුහුදුන් අපට පමණක් නොව බුදුපියාණන්ටද සතුරන් සිටි බැව් නොරහසකි. මෙවන් සතුරු බලවේග කල්තබා හඳුනා ගැනීමට හැකි එකම ක්‍රමවේදය ජ්‍යෝතිෂයේ දක්වා ඇත්තේය.

සතුරන් නිසා පුද්ගලයකුට ඇතිවන මානසික හා කායික "පීඩනයන්ට ගොදුරුවීම සොබාවිකයි. බොහෝවිට සිය මිතුරන් රහසිගත ඉතාම සියුම් ක්‍රම වේදයන් හරහා සතුරුකම් කරන බව පෙනේ. අද වන විට සතුරු බලවේග ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. ව්‍යාපාරිකයෙක්, දේශපාලනඥයෙක් හෝ වෙනත් ක්ෂේත්‍රයක නියැළී සිටින කෙනකුට සතුරු බලවේග ගොඩ නැඟීම ගැන ජ්‍යාතිෂ විද්‍යාවේ කරුණු හෙළිකර තිබේ.

සතුරු කරදර නිසා දිවි නසා ගත් අයත් මුළු ජීවිත කාලයම දුක් විඳින අයත් සමහර විට සියදිවි නසා ගන්නා අයත් මේ අතර වේ.

යම් කායික හා මානසිකමය කරදරයක් සිදු වීමට පෙර ඒවා හඳුනාගෙන එයින් වැළකීමට ඇති එකම මඟ නම් ජ්‍යාතිෂ්‍ය වේ.

සතුරු බලවේග නිසා ඉතාම යහපත් ජීවිතවලට අනතුරුදායක සිදුවීම්වලට මුහුණ දීමට සිදු වී තිබේ.

සතුරු කරදර ගැන පුන පුනා කීමට අවශ්‍ය නැත. නිරන්තරයෙන්ම කාට වුවත් සතුරු පීඩා කොයි මොහොතක හෝ සිදු විය හැක. ජ්‍යාතිෂ විද්‍යාත්මක පදනම මත බලන විට 10 වැන්නාධිපති 6 වැන්නේ වීම 6 පාප පීඩිතව 6 අධිපති ලග්නයේත් ලග්නාධිපති 6 වැන්නේ වීම පාපී පෙනුම පාපීන්ට මැදි වීම නිසා සතුරු පීඩා ගෙන දේ.

3 වැන්නාධිපති 6 වැන්නේ සිටීමද 5 වැන්නාධිපති 6 සිටීමද 4 අධිපති පාපීන් දැකීමද ලග්නය හා දහය අධිපති සතුරුව 10 යේ හෝ ලග්නයේ සිටීමද ලේ නෑයින් සතුරු වන්නේය. සතුරු බලවේග හඳුනා ගැනීමට ඒ ඒ ලග්න අනුව අදාළ ග්‍රහයන්ගේ බල දුබලතා හඳුනාගත යුතුයි. අතිවිශාල පිරිසකගේ කේන්ද්‍ර පරීක්ෂා කිරීමේදී උග්‍ර ලෙස සතුරු පීඩාවන්ට ලක් වී ජීවිතය කඩා වැටුණ අය දුටුවෙමි.

සිතන්නට පවා නොහැකි ලෙස දූ දරුවන් පවුලේ ලේ නෑයින්. එපමණක් නොව සැමියන්, බිරින්දෑවරුන්, සහෝදර සහෝදරියන් ඇතුළු පිරිසක් සතුරන් බවට පත්වන්නේ කෙසේද යන්නත් ගැටලුවකි.

තමා තමාටම සතුරුවන බවත් සියදිවි නසා ගැනීමේදී හෙළිවී ඇත.

සඳු මකරයේ හෝ කුජ මිථුනයේ සිටියදී බලවේග සෑදේ. රවි, කුජ, රාහු ආදි ග්‍රහයින් ගෙන්ද බල දුබලතා හරහාද නැකත් දශා ගෙවී යන ආකාරයටද සතුරු බලවේග ගොඩනැඟේ.

ග්‍රහයන් ස්වක්ෂේත්‍ර උච්ච මිත්‍ර වූ පමණින්ම සුබ තත්ත්වය පමණක් නොව අසුබ තත්ත්වයන් උදාවන බැව් පර්යේෂණවලදී හෙළි වී තිබේ.

මනසට වද දෙන කුජ, රාහු, රවි හෝ කේතු , ශනි, ලග්නගතව දුර්වලවීමත් 6 වැන්න ඉතාම අසුබ තත්ත්වයේ පැවතීම හරහාද සතුරු බලවේග ගොඩ නැඟේ. 8 වැනි මාරකස්ථානයේ ග්‍රහයින් නීච දුර්වල හා සතුරු තත්ත්වයට හසුවීම හරහාද වහා සතුරු බලවේග ගොඩනැඟේ. ජීවිත හානිවලටද ඉඩ තිබේ.


ලිංගිකමය කරුණු හරහා 7 වැන්නේ සහ 8 වැන්නේත් 6 වැන්න මූලාශ්‍රය කොට ඇති වන ග්‍රහ බාධක දෝෂ හේතුකොට ගෙන වහාම සතුරු බලවේග ගොඩනැඟෙන බැව් ග්‍රහ පිරික්සීම් වලදී හෙළිවී ඇත්තේය.

ඔබේ කේන්ද්‍රය ගැඹුරින් පරීක්ෂා කර බලන්න. ඔබට යම් කිසි සැකයක් ඇත්නම් එය උග්‍රවීමට පෙර යථා තත්ත්වයට පත් කර ගැනීමට උපක්‍රමශීලිවීම වැදගත් වේ.

ජ්‍යාතිෂවේදී

**ටී.හෙන්රි බෙම්මුල්ල**






# පොරොන්දම් බලලා විවාහය ඇති කරනවා මිසක් කඩන්න එපා

**විවාහයක් ඇති වන්නෙ පොරොන්දම් පරික්ෂාවකින්ම නොවේ. සංසාරයේ පතා ගෙන ආ විදියටත් විවාහ සිදුවනවා. බිමා, උත්පලවන්නා, පටාචාරාලාගේ විවාහයන් අයහපත් වුණාට ඉතාමත් යහපත් ශ්‍රීයෙන් වූ පතාගෙන ආ විවාහයක් තමයි යසෝදරා සිද්ධාර්ථ. ඒ වගේ විවාහය ඉතා දුර්ලභයි. මේ එකකටවත් පොරොන්දම් බැලුවේ නැහැ. විවාහය නිසා මැරුම් කාපු අයත්, නොසිටියා නොවේ. පොරොන්දම් පරික්ෂාවක් කරන්නෙ සුදුසු ගැළපීමක් බොහෝ දුරම සොයා ගන්න.**

පොරොන්දමක් සියයට සියයක් ගැළපුනත් අතරමගදි කැඩුණු විවාහ ගැන අහල ඇති නේ. විවාහයක් පොරොන්දමෙන් තීරණය කළ හැකිද? ඔන්න ඔබට ප්‍රශ්නයක් මතු වුණා. බැහැ. කොහෙත්ම බැහැ. විවාහයක් නිවැරැදිව හරියන්න පොරොන්දම් පරික්ෂාවට එහා ගිය කරුණුත් තිබෙනවා. පොරොන්දම් පරික්ෂාවට ලක්වන්නෙ ලග්නෙන් චන්ද්‍රයාගෙන් හා සිකුරුගෙන් 1,2,7,8 රාශි විතරයි. කිසියම් ජන්ම පත්‍රයක 6,8,12 දුර්වල වුණොත් ඉවරයිනේ. එනිසා ඒ රාශි ගැනත් ඒ ඒ රාශිවල අයිතිකාරයෝ ගැනත් බලන්න ඕනෑනේ. හොඳයි පොරොන්දම් ගැළපුනා කියමුකෝ. පිරිමියාගේ කේන්දරේ රාහු සෙනසුරු 9 හා 10 රාශිවල නීච හතුරු වුණොත් බිරිඳගේ මුදලෙනුත්, බිරිඳගේ මඟුල් මුද්දත් උගස් තියල මත්පැන් බොන කෙනෙක් ස්වාමියා කරගන්න වේවි. මත්පැන් බොනව නොවේ. මත්පැන් නාන කෙනෙක් වනවා. ස්ත්‍රියගේ කේන්දරයේ 7 වැන්න ශනි – කුජ ඉදල හත්වැන්නාධිපති ඉන් එකෙකුගේ රාශියේ වුණොත් රටේ ප්‍රසිද්ධ නරක ගැහැනියක් වනවා. ඔබ පුත්‍රයෝ බලන්නෙ පුත්‍ර ස්ථානයෙන් විතරනේ. පුත්‍ර ස්ථානය හොඳ වෙලා කාම ත්‍රිකෝණය 3,7,11 දුර්වල නම් දරු සම්පත් ඉතා දුර්වල වේ. එතකොට පොරොන්දම වැඩක් තියෙනවද. පොරොන්දම් කිව්වේ මූලික පරීක්ෂණයක් විතරයි. පොරොන්දම් බලනකොට ඔබ හිතනවට වඩා දුරට බලන්න ඕනෑ. ග්‍රහ පොරොන්දම් දස විසි අෂ්ඨනාඩිය විතරක් මදි බලලා. ජන්මයෙන් ලැබුණු ග්‍රහ බලපෑම් බලන්නත් ඕනෑ. තව දීර්ඝ විස්තර ලියන්ට කලින් ජ්‍යෝතිෂය කරන ආධුනික මහතුන්ට, නෝනලාට එකක් කියන්න කැමැතියි. ඔබ මෑතක සිට ජ්‍යාතිෂ කරන අයෙක් නම් ජ්‍යාතිෂය ගුණා ගුණ, පලා පල බලා කීයක් හරි ගත්තට කාරි නැහැ. නමුත් ජ්‍යාතිෂ්‍ය ගැන පුහුණු දක්ෂතාවයක් නැත්නම් පොරොන්දම් නම් බලන්න පරික්ෂා කරන්න එපා. ඒක තවත් පරම්පරාවක් උදෙසා කරන මහා සටනක්. වැරදුනොත් ඉවරටම ඉවරයි. නැවත හදාන්න බැහැ.

ජ්‍යෝතිෂය කරන ප්‍රසිද්ධ මහත්මයෙක් එක පොරොන්දමක් එයත් පරික්ෂා කරල වැඩි හොඳට මා වෙතට එව්වා. මමත් පරික්ෂා කරල කිව්වා පතාගෙන ආ කේන්දරයක් ධර්ම ස්ථානය හා කර්මස්ථානය හොඳයි. විවාහයට හොඳයි කියලා ඒ අයත් සතුටු වෙලා ගියා. අනිත් පාර්ශ්වයටත් මේක පරික්ෂා කරන්න ඕනෑ නිසා ඒ අයගේ කෙනෙකුටත් පරික්ෂාකර බලන්න කියල දීල තිබෙනවා. ඒක පරික්ෂා කළ ජ්‍යාතිර්වේදියා කියල තිබෙනවා විවාහකස්ථානයේ පාපි දෙකක් සිටිනවා . එනිසා විවාහය කරන්න එපා කියලා. කොහොම හරි විවාහය කළේ නැහැ. මහත්මයා කලකිරිලා පිටරට ගියා. කලකට පස්සේ අර උදවිය වෙනත් කාරණයකට මා හමුවන්න ආවා. මම නිකමට වගේ ඇහැව්වා. කොහොමද අලුත් ජෝඩුව කියලා. එතකොට සිදු වූ සියල්ල කිව්වා. ඒ පාර්ශ්වය පැත්තෙන් පරික්ෂා කළ අයට දුරකතනයෙන් කතා කළා ඔවුන්ගේ අවසරය ඇතිව ඔවුන් ඉදිරියෙදීම. එතකොට ඔහු කිව්වා විවාහකස්ථානයේ පාපි ඉන්න නිසා එපා කිව්වා කියා. මම කවුද කියලා ඔහුට පැහැදිලි කරල මම ඇහැව්ව දෝස භංගවන අයුරු දන්නවද කියලා ඔහු නැහැ කිව්වා. මම පැහැදිලි කළා. ඊට පසු ඔහු සමාව ඉල්ලුවා. වූ වරදට. දැන් ඔහු සමාව ඉල්ලලා වැඩක් නැහැ. සිදුවීම සිදුවෙල ඉවරයි. එතකොට ප්‍රමාද වැඩියි. ඒක නිසා පින් අයිති වේවි. නොදන්නවා නම් දැනීම මදි නම් පොරොන්දම් විතරක් බලන්න එපා. වැරදුනොත් ප්‍රතිඵලය ලැබෙන කොට ලැබෙන්න හිටපු සුරංගනාවිය නොලැබී ගිහින් යකින්නක් ලැබේවි.

අපි පොරොන්දමක් බලන්න ඕනැ විවාහයක් සිදුවන අයුරු හිතේ තබාගෙන. වැරදි පැත්ත විතරක් බලන්න එපා. හොඳටම හොඳ මොනම කේන්දරයක් වත් මේ රටේ නැහැ. විවාහයක් වන මේ දෙදෙනාගේ මූල, ධාතු, හැඟීම්, සම-විෂම, තත්වයන් පරික්ෂා කිරීම තමයි පොරොන්දම් පරික්ෂාව කියන්නේ. පොරොන්දම් කියල කිව්වේ දෙමළ භාෂාවෙන්. සංස්කෘතයෙන් කියන්න නාඩි කූඨය. ලිංග කූඨය කියලා. පුරාණ ශාස්ත්‍ර ක්‍රමය අනුව විවාහ ක්‍රම අටක් තිබෙනවා. බ්‍රහ්ම, දේව, අසුර, ප්‍රජාපතිප, ගාන්ධර්ව, රාක්ෂ, ප්‍රේත හා මනුෂ්‍ය කියලා පොරොන්දම් සම සමව තිබුණත් දෙදෙනාගේ අන්‍යෝන්‍ය වැටහීම තිබෙනවා නම් විවාහ ජීවිතය සාර්ථක කරගත් තැන් නැතුව නොවේ. කේන්දර දෙකක් විනාඩි 10ක් තුළ බලලා හොඳ නරක තීරණය කරන්න බැහැ. පොරොන්දමට අවශ්‍ය කරුණු පරික්ෂා කරල ඊට අමතරව අරිටු යෝග, දරු සම්පත් අහිමි යෝග, ස්ත්‍රී පුරුෂ රෝග වගේ විස්තරත් බලන්න ඕනෑ. “කණකොක් සුද පෙනෙන්නේ ඉගිළී යන විටලු”. කිව්වා වගේ දෙදෙනාගේ දුර්වලකම් පෙනෙන්නේ විවාහයෙන් පසු ටික දිනකට පස්සේ. ඊට ඉස්සෙල්ලා ඒ විවාහපේක්ෂක දෙදෙනාගේ දුර්වලකම් ප්‍රායෝගිකව දැනගන්න අමාරුයි. ඕන කෙනෙක් විවාහයට ප්‍රථම සිල්ගත්ත අය වගෙයි. නවගුණ වැල විතරයි නැත්තේ විවාහයෙන් ටික දවසකට පස්සේ තමයි නාට්‍ය රඟදක්වන්නේ. එනිසා ඒවා ගැන විවාහයට කලින් හොඳ පරික්ෂාවෙන් බලන්න ඕනෑ. මේ දෙපාර්ශ්වයටමයි කියන්නේ. පසුව කලකිරෙන්න එපා. සමහර පිරිමි ඉන්නවා විවාහයට පසු මත්පැන් බෝතලේ බිරිඳට වඩා ලොකු වෙනවා. ඒ වගේම සමහර ගැහැනු ඉන්නවා තම ස්වාමියාට වඩා වෙනත් පිරිමියෙකුගේත් සතුට හොයනවා. එතකොට ඒ පවුල් ජීවිතය ගිණිගොඩක් වනවා.

ගොඩක් ජ්‍යෝතිර්වේදින් පොරොන්දම් ගැළපීමට කේන්දර කොපි දුන්නම, ඒ දෙකහි නැකැත් පොරොන්දම් විපත් හෝ වද නම් ඒ කේන්දර පරික්ෂා කරන්නෙ නැහැ. එහෙම කරන්න එපා. තවත් සමහර අය ඉන්නවා සරාගි යෝග හෝ නටාංශක යෝග, කඩහන්දිය තිබෙනවා නම් ගන්නෙ නැහැ. එහෙම කරන්නත් එපා. ඒවාට පිළියම් තිබෙනවා. ඒ පිළියම් නොදන්න නිසා තමයි එහෙම කේන්දර ප්‍රතික්ෂේප කරන්නේ. රටේ සිටි ප්‍රසිද්ධ අයත් එහෙම කළා. පසුව හදා ගත්තා. එකකටවත් නොගැළපෙන කේන්දර මෙලොව උපදින්නෙ නැහැ. සමහර පොරොන්දම් ගැළපුනත් ශරීරවල තිබෙන දොස් නිසා විවාහ වුණත් කරදර ඇතිවනවා. බොහෝ අය කියන එකක් තමයි කේමද්‍රැම යෝගය තිබුණොත් හිඟාකනවා කියන එක. ඒ කිව්වේ කේන්දරයක චන්ද්‍රයා දෙපස කිසිදු ග්‍රහයෙකු නොමැති වීමයි. පංච මහා පුරුෂ යෝගයක ඉපදුනත් ඉතිරි ග්‍රහයෝ නරක නම් ඉතින් ජීවිතයේ ඉදිරි කාලය අයහපත් වනවා.

බොහෝ අය 7 වැන්නෙ අඟහරුවා, සෙනසුරා, හිටි පළියට පාපි කේන්දර කියල අයින් කරනවා. එතකොට ඒ අය විවාහ වන්නෙ නැද්ද? එහෙනම් නිවැරැදිතාවය මොකක්ද කියල බලන්න ඕනෑ. කොතැනක හරි මොනම ග්‍රහයෙකු හොඳින් ඉන්නවා නම් යහපත ඇති කරනවා. ඒ ග්‍රහයම නරකට ඉන්නවා නම් අයහපත ඇති කරනවා.

මූලිකව දැනගත යුත්තේ එච්චරයි. ඔය නාමික වශයෙන් පාපි කිව්වෙ කුජ හා ශනි විතරක් නොවේ. ඇයි රවි – අව සඳු, රාහු කේතු, මෙවන් පාපි ග්‍රහයෝ තමයි. කුජ හා ශනි 7 වැන්නෙ හිටි පළියටම පාපි වන්නෙ නැහැ. ඒ රාශින්වල එහෙම ඉදලා හතුරු හෝ නීච වුණොත් විතරයි පාපි වන්නේ. එහෙම ඉඳලත් දීප්තිමත් චන්ද්‍රයා හෝ බ්‍රහස්පති දකිනවා නම් ඒ දෝෂය භංගවනවා. දෝෂ භංගවලින් එකක් තමයි ඔය. මේ න්‍යායන් ඉගෙන ගන්නෙ නැතුව නිකන් ග්‍රහයෝ හිටි පළියට එක එක නම් දමන්න එපා. බොහෝ අය කරන තවත් වැරැද්දක් තමයි කාල සර්ප යෝගය පිහිටියොත් ඒ කේන්දරත් ගන්න එපා කියනවා. මොකද කියල ඇහැව්වාම කාල සර්ප යෝගය පිහිටලාලු. මොකක්ද මේ කාල සර්ප යෝගය කියල ඇහැව්වාම උඩබිම බලනවා. ඕනෑම කේන්දරයක කාල සර්ප යෝගය 12 ආකාරයට පිහිටනවා. ඉන් එක පිහිටීමක් තමයි 3 වැනි රාශියෙන් පටන් අරන් 9 වැනි රාශියෙන් අවසන් කරනවා. අනිත් පිහිටීම තමයි 5 වැනි රාශියෙන් පටන් අරන් 11 වැනි රාශියෙන් ඉවර කරනවා. අනිත්වා බලවත් නැහැ.

05 පිටුවට...

පාරම්පරික ගුප්ත විද්‍යාධර /ජ්‍යෝතිර්වේදී
**මීපේගණිතගේ රන්ජිත් විද්‍යාරත්න**

04 පිටුවෙන්...

සමහර අය ගොඩක් ආඩම්බර වනවා. තම පුතුට, දුවට පංච මහා පුරුෂ යෝගයක් පිහිටියාම. ඒක අඥානකමක්. ගුරු හංස යෝගය පිහිටියාම මාලව් යෝගයේ ඵල ඇතිවන්නෙ නැහැ. අනිත් යෝගත් එහෙමයි. උදාහරණයක් ගත්තොත් අපෙන් වෙන්වූ ලලිත් ඇතුලත්මුදලි මහත්මයා සස යෝගයෙන් උපන් කෙනෙක්. ඒ කේන්ද්‍රයේ 7 වැන්නෙ සෙනසුරු බලවත්ව ඉන්නවා. ඒ කිව්වේ කුම්භයේ, හොඳට ඉගෙන ගත්තා. බැරිස්ටර් වුණා. නමුත් හදිසියෙම අනුන්ට ගහපු බෝම්බයකින් මෙලොව හැර ගියා. ඒ කිව්වේ සස යෝගය පිහිටියත්. 11වැන්නෙ හතුරු අඟහරුවා හා නීච කේතා හිටපු නිසා ඒකත් පලදුන්නා. කෝ ඉතින් පංච මහ පුරුෂ යෝගය නිසා බේරුනාද? මේවා ගැන හොඳට හිතන්න ඕනෑ. හොඳට මුදල් තිබෙන අය ළමා කාලයේ මරණයට පත්වන්නෙ නැද්ද? ඒකනේ ජ්‍යොතිෂය කිව්වේ මැණික් ගලක් වගේ කියලා. හැම පැත්තටම හරව හරවා බලන්න ඕනෑ. එතකොටයි නියම මැණික තෝරගන්න පුළුවන් වන්නේ. හරියටම පොරොන්දමක් පරීක්ෂා කළොත් ඒ අයට ප්‍රශ්න කීපයක් මතුවනවා. එහෙම වන්නෙ නියම විදියට කරුණු අවබෝධ වුණාමයි. පොරොන්දම් බැලීමේදී චන්ද්‍රයා ඉතා වැදගත් කරුණු අනාවරණය කරනවා.

චන්ද්‍රයා කිව්වේ සතුටේ අධිපතියා. හරියට පවුලක අම්මා වගේ. හැබැයි පුර චන්ද්‍රයා හොඳේ. අව චන්ද්‍රයා වුණොත් ක්‍රෑර නැන්දම්මා වගේ තමයි. මේවා පිළිවෙළට තේරුම් ගන්න ඕනෑ. මම ඒකයි කිව්වේ පොරාන්දම්වල කරුණු දැනීම මේවා හරියට පළපුරුද්දෙන් අවබෝධය නැත්නම් දෙවරක් හිතන්න කියලා. මේ ලෝකේ හැම දෙයක්ම අපි දන්නෙ නැහැ. ඒකට ලජ්ජා වන්න ඕනත් නැහැ. අපි නොදන්න කොච්චර දේවල් තිබෙනවද? ඒක තමයි උගත්කම කිව්වේ. මම නොදන්නවා නම් දන්නෙ නැහැ කියල ඒක ඉගෙන ගන්නවා.

අපේ ජ්‍යෝතිර්වේදීන් කරන තවත් වැරැද්දක් තමයි ජන්ම පත්‍රයේ 1,4,7,10 යන රාශිවල ග්‍රහයෝ. නැත්නම් කේන්ද්‍රය පාළුයි කියනවා. ඒ කේන්ද්‍ර සුදුසු මහණ කරන්නලු. නමුත් ඒක මහණ යෝගයකුත් නොවෙයිලු. යෝග නැත්නම් මහණ වෙන්නෙ කොහොමද? අපේ හාමුදුරුවන් වහන්සේලාගේ ගුරුවරයා. අපේත් ගුරුවරයා තමයි. බුදුහාමුදුරුවන්ගේ හතර කේන්ද්‍රය පාළුද? හතර කේන්ද්‍ර රාශි හිමි ග්‍රහයෝ. එකෙක්වත් බලවත්ද නැද්ද? මේවා අපි හදාගත් මත. එක රාශියක කිසියම්ම ග්‍රහයෙක් හොඳට හෝ නරකට හිටියට ඒ ග්‍රහයා සම්පූර්ණයෙන් බලවත් හෝ දුර්වල නැහැ. ඒ ග්‍රහයා ඉන්නෙ ඒ රාශියෙ කොතැනද කියලා බලන්න ඕන නේ. මොකද එක රාශියක පරතරය අංශක 30යි. රාශියේ ආරම්භයෙම පිහිටියොත් කලින් රාශියටත් රාශියේ අවසානයට පිහිටියොත් පසු රාශියටත් ග්‍රහ රශ්මිය එනවා. එකමයි කිව්වේ ග්‍රහයකුට පියවර 3ක් කියලා. බොහෝ අය නොකළාට නවාංශකයෙන් ගුණා ගුණ කියනව නම් ලග්නෙට වඩා සූක්ෂමයි. නිවැරැදියි. නිවැරැදි නවාංශකය හදාගන්න කොට සමහර විට ලග්නයද වෙනස්වනවා. ඒක පරිගණකයේ නම් සිදුවන්නෙ නැහැ. මොකද පරිගණකයේ තිබෙන්නෙ අප ඇතුළු කළ දත්ත පද්ධතියක් විතර නිසා. නිවැරැදි ජන්ම පත්‍රයක් හදාගන්න අමාරුයි. අද ගොඩක් අය ඉන්නෙ බොත්තම් මිරිකන අයනේ. පුරුදු වුණ අයට වඩා පුරුදු කළ අයට තමා දොස් කියන්න වටින්නේ.

දසයද තුන්වනු ඉරු- සඳු, ශනි, දකිති - සෙනසුරු අටවනු

කුජ, බුධ දකිති - නවයද පස්වනු ගුරු කිව් දකිති සත්වනු පස්වනු මේ හැම දකිති.

මේ ග්‍රහ දෘෂ්ටි කොම්පියුටරවල නැහැ. මේ කවිය බලන ඕනෑම කෙනෙක් කේන්ද්‍රයක දෝස තිබුනට බොරු බය ගන්ට එපා. ඒවා නිදොස් කරන්න ශාන්ති කර්ම තිබෙනවා.

මම නැවත නැවතත් කියන්නෙ විවාහ දෝස විතරක් නොවේ මාරක දෝසත් මගහරව ගන්ට තරම් අපේ ගුප්ත ශාස්ත්‍රය පොහොසත්. හැබැයි නියම කෙනා තෝරා ගන්න. අපේ සමාජයේ ලොකු ප්‍රශ්නයක් තමයි. විවාහ ප්‍රමාද වීම්. මේකට හේතු කීපයක් තිබෙනවා. එකක් තමයි පාපකර්ම විවාහ ප්‍රමාද කරන ග්‍රහ බලපෑම්. හා ඊට පිළියම් නොකිරීම, විවාහ පොරොන්දමේ මූලික කරුණක් තමයි දරුඵල. එහෙනම් පොරොන්දම් පරීක්ෂාවෙදි. ලිංග පොරොන්දම, යෝනි පොරොන්දම, වෘක්ෂ පොරොන්දම හා සුබ චන්ද්‍රයා යහපත් නම් මූලික ලක්ෂණ හරි. ඔබ ලකුණු මට්ටම ගැන එච්චර උනන්දුවක් වන්න එපා. ලකුණු මට්ටම ටිකක් අඩුවෙලා කලින් කිවු කාරණා යහපත් නම් ඒක තෝරගන්න. මේ කරුණු නරක්වෙලා ඉහළ ගිය ලකුණු මට්ටම නිසා විවාහය තෝරා ගත්තොත් විවාහවෙලා අවුරුදු 2 හෝ 3කින් දෙන්නගෙන් කෙනෙක් දබර කරගෙන ගෙදර ඒවි. එතැනින් විවාහය කෙළවර වේවි.



# මුත්‍රා රෝග ඇති කරන ග්‍රහ පිහිටීම්


**වර්තමාන සමාජයේ මුත්‍රා රෝගවලින් පීඩා විඳින ජන සංඛ්‍යාව ඉහළය. මුත්‍රා පරීක්ෂණය සඳහා රෝහල්වලට පැමිණෙන රෝගීන්ගේ සංඛ්‍යාව මඟින් එහි සත්‍යතාවය තහවුරු වන්නේය. ඒ අනුව ස්ත්‍රීන් හා පුරුෂ යන් අතරින් ස්ත්‍රීන්ට මුත්‍රා රෝග වැලඳීමේ ප්‍රවණතාවය ඉතා ඉහළය. එයට හේතුව පුරුෂයන්ට වඩා ස්ත්‍රීන්ගේ මුත්‍රා මාර්ගය කෙටි වීමයි.**

ජ්‍යෝතිෂ ශාස්ත්‍රයට අනුව මුත්‍රා රෝග වැලඳීමට හේතු භූත වන ග්‍රහ බලපෑම් ගැන කරුණු පරීක්ෂා කර බැලීමේදී ලග්න කේන්ද්‍රය මෛත්‍ර ලිංගික පද්ධතිය, නිවේදනය කෙරෙන 7 වැන්න, එහි අධිපතිගේ බල දුබලතාවයන් ගැනත්, විශ්ව කේන්ද්‍රය වන මේෂ ලග්නයේ කාල පුරුෂ න්‍යායට අනුව මිනිස් සිරුරේ අවයව කොටස් 12කට බෙදා වෙන් කළ විට විශ්ව කේන්ද්‍රයේ මෛත්‍ර ලිංගික පද්ධතිය නිවේදනය කෙරෙන 7 වැන්න වූ තුලා රාශියත් එහි අධිපති සිකුරුගේ බල දුබලතා ගැනත් පරීක්ෂා කර බැලිය යුතු වන අතර, ඒ අනුව යට කී භාවයන් සහ එහි අධිපතියන්, සහජ පාපීන් වැඩි දෙනෙකු දෘෂ්ටියෙන් සංයෝගයෙන් සහ 6,8,12 යන දුෂ්ට භාවාධිපතියන්ගේ දෘෂ්ඨියට, සංයෝගයට ලක්ව පීඩාවූ කල එවන් ග්‍රහ බලයක් ඇති ජන්මියා මුත්‍රා රෝගියකු බවට පත් වන්නේය. මෙහිදී ලග්නයත් ලග්නාධිපති පීඩා වී ඇත්නම් එකී රෝගී තත්ත්වය දෛනික ජීවිතයට බාධා අවහිරතා ඇති කරන රෝගයක් බවට පත් වන්නේය. ඉහත විග්‍රහ කළ කරුණු ගැන නිරවුල් අවබෝධයක් ලබා ගැනීමට පහත දැක්වෙන වෘෂභ ලග්න කේන්ද්‍රය අධ්‍යයනය කරමු.

ඉහත වෘෂභ ලග්න කේන්ද්‍ර හිමියා මුත්‍රාශයේ ගල් ඇතිවීම හේතු කොට ගෙන කලකට ඉහතදී වෛද්‍ය ප්‍රතිකාර ලැබ සුවය ලැබ නැවත නැවත මුත්‍රා රෝග වැලඳීම හේතු කොටගෙන වෛද්‍ය ප්‍රතිකාර ගත් කෙනෙකි. ඒ පිළිබඳව ඉහත කේන්ද්‍රයට අනුව කරුණු පරීක්ෂා කර බැලීමේදී මූත්‍රා රෝග වැලඳීමට හේතු වන භාවයක් වන 7 වැන්නේ 5 අධිපති බුධ සිටීම එම බුධ 7 වැන්නාධිපති කුජ සමඟ මහා පරිවර්තන රාජ යෝගයක් උදා කර තිබීම ශුභ යැයි පෙනුණද මහා පරිවර්තන යෝගයට සම්බන්ධ වෘෂභ ලග්නයට 7 -12 පාපීන් වීමත් 7 වැන්නෙහි පතිත බුධට 6 වැන්නෙහි නීච රවි, සතුරු 8 අධිපති ගුරු, ස්වක්ෂේත්‍රව නමුත් වක්‍ර නිසා දුර්වල වූ සිකුරු සිටීමත් එලෙස සිකුරුගෙන්, ගුරුගෙන් රාහුගෙන් පීඩා වූ නීච රවිගේ පූර්ණ දෘෂ්ටියක් මෙන්ම පාපී කේතුගේ පූර්ණ දෘෂ්ටියත් 7 වැන්නේ 2 වැන්න වූ 8 වැන්න වැටීමෙන් 7 වැන්න සහ එහි පතිත බුධ බලවත් පාප කර්තරීභ යෝගයකට මැදිව පීඩා වී ඇත.

ඒ මෛත්‍ර ලිංග පද්ධතිය නිවේදන කෙරෙන තවත් භාවයක් වන තුලාව ලග්නයෙන් 6 වැන්න හෙවත් රෝග ස්ථානයට වැටි එහි සිටින නීච රවි සහ 8 අධිපති සතුරු ගුරු එහි අධිපති ස්වක්ෂේත්‍ර නමුත් වක්‍ර නිසා දුර්වල වූ සිකුරුට පීඩා කිරීමත්, 10 වැන්නේ සිටින රාහුගේ පූර්ණ දෘෂ්ඨිය එම සිකුරුට වැටීමෙන් සිකුරු බෙහෙවින්ම පීඩා වීම ඉහත වෘෂභ ලග්න කේන්ද්‍ර හිමියා මුත්‍රා රෝගියෙක් බවට පත්වීමට හේතු වී ඇති බව අපට අවසාන වශයෙන් නිගමනය කළ හැකි වන්නේය.

ජ්‍යෝතිෂවේදී
**උදම් පෙරේරා**



# සතියේ පඤ්චාංගය

**ශක වර්ෂ 1945ක් වූ මේෂ රවි 08 භාග වෙසක් පුර පෑලවිය තිථිය ලත් කිවි දින සිට එම රවි 14 භාග වෙසක් පුර සතවක ලත් ගුරු දින දක්වායි.**

## ග්‍රහයෝ සහ රාශි

රවි – මේෂ
කුජ – මිථුන
බුධ – මේෂ (වක්‍ර)
ගුරු – මීන ( 22 දා අලුයම 05.13 මේෂ)
ශුක්‍ර – වෘෂභ
ශනි – කුම්භ
රාහු – මේෂ
කේතු – තුලා
යුරේනස් – මේෂ
නැප්චූන් – මීන

## ග්‍රහයෝ සහ නැකැත්

රවි – අස්විද
කුජ – අද (22දා උදේ 08.51 පුනාවස)
බුධ – බෙරණ
ගුරු – රේවතී ( 22දා අලුයම 05.13 අස්විද)
ශුක්‍ර – රෙහෙණ ( 26දා සවස 03.36 මුවසිරස)
ශනි – සියාවස
රාහු – අස්විද
කේතු – සා
යුරේනස් – බෙරණ
නැප්චූන් – පුවපුටුප

## පෝය

අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා සවස 01.41න් පුර අටවක ලබා 28 සිකුරාදා සවස 04.03න් ගෙවේ. 27 බ්‍රහස්පතින්දා සිල්

## චන්ද්‍ර චාරය

අප්‍රේල් 22 දා අලුයම 05.04 වෘෂභ
අප්‍රේල් 24දා සවස 01.17 මිථුන
අප්‍රේල් 27දා රාත්‍රි 12.20 කටක

## දින තත්ත්වය

**අප්‍රේල් 21 සිකුරාදා**
මේෂ රවි 08 භාග වෙසක් පුර පෑලවිය තිථිය ලත් කිවි දින. ඉර උදාව 06.00 ඉර බැසීම 06.19 බෙරණ නැකත රාත්‍රී 11.04න් ගෙවී කැති නැකත ලබයි. වෙසක් පුර පෑලවිය තිථිය උදේ 08.32න් ගෙවී පුර දියවක තිථිය ලබයි. ප්‍රීති යෝගය දහවල් 11.03න් ගෙවී ආයුෂ්මත් යෝගය ලබයි. බව කරණය උදේ 08.32න් ගෙවී බාලවකරණය ලබා එය රාත්‍රී 08.11න් ගෙවී කෞලවකරණය උදාව පවතී.
විෂ කලාව – ළැම
අමෘත කලාව – මාපටැඟිලි
මරු – ගිනිකොන යෝගිනි – නැඟෙනහිර
සුබ දිසාව – දකුණ

**අප්‍රේල් 22 සෙනසුරාදා**
මේෂ රවි 09 භාග වෙසක් පුර දියවක තිථිය ලත් ශනි දින. ඉර උදාව 06.00 ඉර බැසීම 06.19. කැති නැකත රාත්‍රී 11.29න් ගෙවී රෙහෙණ නැකත ලබයි. වෙසක් පුර දියවක තිථිය උදේ 07.53න් ගෙවී පුර තියවක තිථිය ලබයි. ආයුෂ්මත් යෝගය උදේ 09.28න් ගෙවී සෞභාග්‍ය යෝගය ලබයි. කෞලවකරණය උදේ 07.53න් ගෙවී තෛතිලකරණය ලබා එය රාත්‍රී 07.50න් ගෙවී ගරජකරණය උදාව පවතී.
විෂ කලාව – තනය
අමෘත කලාව – පතුල
මරු – නැඟෙනහිර යෝගිනී – උතුර
සුබ දිසාව – දකුණ

**අප්‍රේල් 23 ඉරිදා**
මේෂ රවි 10 භාග වෙසක් පුර තියවක තිථිය ලත් රවි දින. ඉර උදාව 06.00 ඉර බැසීම 06.18. රෙහෙණ නැකත දවස පුරාම යෙදී පවතී. වෙසක් පුර තියවක තිථිය උදේ 07.51න් ගෙවී පුර ජලවක තිථිය ලබයි. සෞභාග්‍ය යෝගය උදේ 08.24න් ගෙවී ශෝභන යෝගය ලබයි. ගරජකරණය උදේ 07.51න් ගෙවී වණිජකරණය ලබා එය රාත්‍රී 08.07න් ගෙවී විෂ්ටිකරණය උදාව පවතී.
විෂ කලාව – ගෙල
අමෘත කලාව – කෙණ්ඩ
මරු – උතුර යෝගිනි – ගිනිකොන
සුබ දිසාව – දකුණ

**අප්‍රේල් 24 සඳුදා**
මේෂ රවි 11 භාග වෙසක් පුර ජලවක තිථිය ලත් සඳු දින. ඉර උදාව 05.59 ඉර බැසීම 06.18. රෙහෙණ නැකත රාත්‍රී 12.31න් ගෙවී මුවසිරස නැකත ලබයි. වෙසක් පුර ජලවක තිථිය උදේ 08.28න් ගෙවී පුර විසේනිය තිථිය ලබයි. ශෝභන යෝගය උදේ 07.50න් ගෙවී අතිගණ්ඩ යෝගය ලබයි. විෂ්ටිකරණය උදේ 08.28න් ගෙවී බවකරණය ලබා එය රාත්‍රී 09.03න් ගෙවී බාලවකරණය උදාව පවතී.
විෂ කලාව – නාසය
අමෘත කලාව – දණහිස
මරු – වයඹ
යෝගිනි – නිරිත සුබ දිසාව – දකුණ

**අප්‍රේල් 25 අඟහරුවාදා**
මේෂ රවි 12 භාග වෙසක් පුර විසේනිය තිථිය ලත් කුජ දින. ඉර උදාව 05.59 ඉර බැසීම 06.18. මුවසිරස නැකත අලුයම 02.10න් ගෙවී අද නැකත ලබයි. වෙසක් පුර විසේනිය තිථිය උදේ 09.44න් ගෙවී පුර සැටවක තිථිය ලබයි. අතිගණ්ඩ යෝගය උදේ 07.46න් ගෙවී සුකර්ම යෝගය ලබයි. බාලවකරණය උදේ 09.44න් ගෙවී කෞලව කරණය ලබා එය රාත්‍රී 10.35න් ගෙවී තෛතිලකරණය උදාව පවතී.
විෂ කලාව – ඇස
අමෘත කලාව – ලිංග, යෝනි
මරු – බටහිර යෝගිනි – දකුණ
සුබ දිසාව – නැඟෙනහිර

**අප්‍රේල් 26 බදාදා**
මේෂ රවි 13 භාග වෙසක් පුර සැටවක තිථිය ලත් බුධ දින. ඉර උදාව 05.58 ඉර බැසීම 06.18. අද නැකත අලුයම 04.22න් ගෙවී පුනාවස නැකත ලබයි. වෙසක් පුර සැටවක තිථිය උදේ 11.31න් ගෙවී පුර සතවක තිථිය ලබා පවතී. සුකර්ම යෝගය උදේ 08.08න් ගෙවී ධෘති යෝගය ලබයි. තෛතිලකරණය උදේ 11.31න් ගෙවී ගරජකරණය ලබා පවතී.
විෂ කලාව – කන
අමෘත කලාව – පෙකනිය
මරු – නිරිත යෝගිනි – බටහිර
සුබ දිසාව – දකුණ

**අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා**
මේෂ රවි 14 භාග වෙසක් පුර සතවක තිථිව ලත් ගුරු දින. ඉර උදාව 05.58 ඉර බැසීම 06.18. පුනාවස නැකත උදේ 07.01න් ගෙවී පුෂ නැකත ලබයි. වෙසක් පුර සතවක තිථිය දහවල් 01.41න් ගෙවී පුර අටවක තිථිය ලබයි. ධෘති යෝගය උදේ 08.48න් ගෙවී ශූලයෝගය ලබයි. ගරජකරණය රාත්‍රී 12.34න් ගෙවී වණිජකරණය ලබා එය දහවල් 01.41න් ගෙවී විෂ්ටිකරණය උදාව පවතී.
විෂ කලාව – බැම
අමෘත කලාව – ළැම
මරු – දකුණ
යෝගිනි – වයඹ
සුබ දිසාව – උතුර

## සතියේ ලග්න උදව

| | මේෂ උදේ | වෘෂභ | මිථුන | කටක | සිංහ දවල් | කන්‍යා | තුලා | වෘශ්චික | ධනු | මකර රාත්‍රි | කුම්භ | මීන අලුයම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 ශු | 05.40 | 07.32 | 09.36 | 11.45 | 01.52 | 03.50 | 05.45 | 07.45 | 09.56 | 12.07 | 02.06 | 03.53 |
| 22 ශ | 05.36 | 07.28 | 09.32 | 11.41 | 01.48 | 03.45 | 05.41 | 07.41 | 09.52 | 12.03 | 02.02 | 03.50 |
| 23 ර | 05.32 | 07.24 | 09.28 | 11.37 | 01.44 | 03.41 | 05.37 | 07.37 | 09.48 | 12.00 | 01.58 | 03.45 |
| 24 ච | 05.28 | 07.20 | 09.24 | 11.33 | 01.40 | 03.37 | 05.33 | 07.33 | 09.44 | 11.56 | 01.54 | 03.41 |
| 25 කු | 05.24 | 07.16 | 09.20 | 11.30 | 01.36 | 03.33 | 05.30 | 07.30 | 09.40 | 11.52 | 01.50 | 03.37 |
| 26 බු | 05.20 | 07.12 | 09.16 | 11.26 | 01.32 | 03.30 | 05.26 | 07.26 | 09.36 | 11.48 | 01.45 | 03.33 |
| 27 ගු | 05.16 | 07.08 | 09.12 | 11.22 | 01.28 | 03.26 | 05.22 | 07.22 | 09.32 | 11.44 | 01.40 | 03.30 |

## කාල හෝරාව ගෙවී යන අයුරු

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 ශු | ශු 06.00 | බු 07.00 | ච 08.00 | ශ 09.00 | ගු 10.00 | කු 1100 | ර 12.00 | ශු 01.00 | බු 02.00 | ච 03.00 | ශ 04.00 | ගු 05.00 | කු 06.00 |
| 22 ශ | ශ 06.00 | ගු 07.00 | කු 08.00 | ර 09.00 | ශු 10.00 | බු 11.00 | ච12.00 | ශ 01.00 | ගු 02.00 | කු 03.00 | ර 04.00 | ශු 05.00 | බු 06.00 |
| 23 ර | ර 06.00 | ශු 07.00 | බු 08.00 | ච 09.00 | ශ 10.00 | ගු 11.00 | කු 12.00 | ර 01.00 | ශු 02.00 | බු 03.00 | ච 04.00 | ශ 05.00 | ගු 05.59 |
| 24 ච | ච 05.59 | ශ 06.59 | ගු 07.59 | කු 08.59 | ර 09.59 | ශු 10.59 | බු 11.59 | ච 12.59 | ශ 01.59 | ගු 02.59 | කු 03.59 | ර 04.59 | ශු 05.59 |
| 25 කු | කු 05.59 | ර 06.59 | ශු 07.59 | බු 08.59 | ච 09.59 | ශ 10.59 | ගු 11.59 | කු 12.59 | ර 01.59 | ශු 02.59 | බු 03.59 | ච 04.59 | ශ 06.05 |
| 26 බ | බු 05.58 | ච 06.58 | ශ 07.58 | ගු 08.58 | කු 09.58 | ර 10.58 | ශු 11.58 | බු 12.58 | ච 01.58 | ශ 02.58 | ගු 03.58 | කු 04.58 | ර 05.58 |
| 27 ගු | ගු 05.58 | කු 06.58 | ර 07.58 | ශු 08.58 | බු 09.58 | ච 10.58 | ශ 11.58 | ගු 12.58 | කු 01.58 | ර 02.58 | ශු 03.58 | බු 04.58 | ච 05.58 |

## නිරයන ග්‍රහස්ඵුට

| | රවි මේෂ | සඳු මේෂ | කුජ මිථුන | බුධ මේෂ | ගුරු මීන | ශුක්‍ර වෘෂභ | ශනි කුම්භ | රාහු මේෂ | යුරේනස් මේෂ | නැප්චූන් මීන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 ශු | 06.28.57 | 17.10.20 | 19.24 | 21.26 | 29.46 | 17.11 | 10.26 | 10.12 | 23.41 | 02.15 |
| | | වෘෂභ | | වක්‍ර | මේෂ | | | | | |
| 22 ශ | 07.27.32 | 00.30.59 | 19.56 | 21.25 | 00.01 | 18.19 | 10.31 | 10.09 | 23.44 | 02.17 |
| 23 ර | 08.26.06 | 13.31.58 | 20.29 | 21.19 | 00.15 | 19.28 | 10.36 | 10.05 | 23.48 | 02.19 |
| 24 ච | 09.24.37 | 26.13.50 | 21.01 | 21.07 | 00.29 | 20.36 | 10.41 | 10.02 | 23.51 | 02.21 |
| | | මිථුන | | | | | | | | |
| 25 කු | 10.23.06 | 08.38.37 | 21.33 | 20.49 | 00.44 | 21.45 | 10.46 | 09.59 | 23.54 | 02.22 |
| 26 බු | 11.21.34 | 20.49.19 | 22.06 | 20.27 | 00.58 | 22.53 | 10.51 | 09.56 | 23.58 | 02.24 |
| | | කටක | | | | | | | | |
| 27 ගු | 12.19.58 | 02.49.45 | 22.39 | 20.01 | 01.12 | 24.01 | 10.56 | 09.53 | 24.01 | 02.26 |

සැකසීම
සංජීව
අඹුවන්ගල

## බබාගේ නමට අකුරු

**අප්‍රේ. 21 සිකුරාද සිට අප්‍රේ.27 වන බ්‍රහස්පතින්ද දක්වා වූ සතිය තුළ දී උපදින දු පුතුන් හට සුබ නාමාක්ෂර පහත පරිදි ගළපා නම් තබන්න.**

### 14 කිවිද

මෙදින උදේ 09.15 දක්වා උත්‍රසල නැකත යෙදී පවතින නිසා බෙ,බො, ජ,ජී අකුරුත් ඉන්පසුව උදාවන සුවන නැකතට හිමිවන ජු,ජෙ,ජො,ෂ අකුරුත් දිනයට සුදුසු වන ච,ඡ,ජ අකුරුත් ගළපා නම් තබන්න.

### 15 ශනිද

මෙදින උදේ 07.37 දක්වා සුවන නැකත යෙදී පවතින නිසා ජු,ජෙ,ජො, ෂ අකුරුත් ඉන්පසුව උදාවන දෙනට නැකතට හිමිවන ග, ගි, ගු, ගෙ අකුරුත් දිනයට සුදුසු වන ප,බ,හ,ම අක්ෂරත් සුදුසු වේ.

### 16 රිවිද

මෙදින අලුයම 05.53 දක්වා යෙදී පවතින දෙනට නැකතට හිමිවන ග,ගි, ගු, ගෙ අකුරුත් ඉන්පසුව උදාවන සියාවස නැකතට හිමිවන ගො,ස,සි, සු අකුරුත් දිනයට සුදුසු වන අ,ආ, ඉ,ඊ,උ,ඌ,එ,ඒ,ඔ,ඕ අක්ෂරත් සුබදායකයි.

### 17 සඳුද

මෙදින අලුයම 04.08 දක්වා සියාවස නැකතට හිමිවන ගො,ස, සි, සු අකුරුත් ඉන්පසුව උදාවන පුවපුටුප නැකතට යෙදෙන සෙ,සො, ද, දි අකුරුත් දිනයට සුදුසු වන ය,ර,ල,ව,ස,හ,ශ,ෂ අක්ෂරත් ගළපා නම් තබන්න.

### 18 කුජද

මෙදින අලුයම 02.30 දක්වා පුවපුටුප නැකත යෙදෙන නිසා සෙ,සො, ද, දි අකුරුත් ඉන් පසුව උදාවන උත්‍රපුටුප නැකතට හිමිවන දු,ථ අකුරුත් දිනයට ගැළපෙන ක,ඛ,ග,ඩ අක්ෂරත් ගළපා නම් තබන්න.

### 19 බුධද

මෙදින අලුයම 01.04 දක්වා උත්‍රපුටුප නැකත යෙදී පවතින දු,ථ අකුරු හා එතැන් පටන් රාත්‍රි 11.57 දක්වා යෙදී පවතින්නේ රේවතී නැකත බැවින් දෙ,දො,ච,චි අකුරුත් ඉන්පසුව උදාවන අස්විද නැකතට හිමිවන චු, චෙ,චො,ල අකුරුත් දිනයට සුදුසු වන ට,ඩ,ණ අක්ෂරත් සුබදායකයි.

### 20 ගුරුද

මෙදින රාත්‍රි 11.15 දක්වා අස්විද නැකත යෙදී පවතින නිසා චු,චෙ,චො,ල අකුරුත් ඉන්පසුව උදාවන බෙරණ නැකතට හිමිවන ලි, ලු, ලෙ,ලො අකුරුත් දිනයට සුදුසු ත,ද,ධ,න අක්ෂරත් සුබදායකයි.

## ග්‍රහ දෘෂ්ටි

21 කිවිදා
උදේ 10.08 ච, තු, ෂඩ්
දහවල් 01.37 ච, බු, සං
23 රිවිදා
රාත්‍රී 12.31 ච, ශ, චතු
සවස 06.14 ච, ශු, සං
24 සඳුදා
උදේ 08.50 බු, කු, ෂඩ්
දවල් 02.20 ච, ගු, ෂඩ්
25 කුජදා
උදේ 09.42 ර, ච, ෂඩ්
උදේ 10.11 ච, ශ, ත්‍රි
සවස 04.19 ර, ශ, ෂඩ්
26 බුධදා
අලුයම 05.18 ච, බු, ෂඩ්
උදේ 08.39 ච, කු, සං
27 ගුරුදා
අලුයම 02.40 ච,ගු, චතු

## සුබ දවස්

21දා රාත්‍රි 11.04න් පසු සුබයි
22දා මුළු දවසම සුබයි
23දා උදේ 07.51 දක්වා සුබයි
25දා උදේ 09.44න් පසු සුබයි
26දා දහවල් 11.31න් පසු සුබයි
27දා උදේ 08.48 දක්වා සුබයි

## රාහු කාලය

21 ශු - උදේ 10.37 - 12.10, රාත්‍රී 10.41 -12.10
22 ශ - උදේ 09.04 -10.37, රාත්‍රී 09.14 -10.42
23 ර - සවස 04.45 -06.18, අලුයම 04.31 -05.59
24 ච - උදේ 07.31 -09.04 , රාත්‍රී 07.45 -09.13
25 කු - සවස 03.13 -04.46, අලුයම 03.03 -04.31
26 බු - දවල් 12.08 -01.41, රාත්‍රී 12.08 -01.37
27 ගු – දවල් 01.40 - 03.13, අලුයම 01.35 -03.03

# මේ සතියේ ඔබට

අප්‍රේ. 21 සිට අප්‍රේ. 27 දක්වා

ධම්මිකා රාජපක්ෂ

## මේෂ — ණය ගනුදෙනුවකින් නිදහස්

අමතර වගකීම් බහුල කරමින් සතිය ආරම්භ වන මේෂ ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 1,2,3,4 යන භාවස්ථාන වලයි. හිතුවක්කාර තීරණයක් හේතුවෙන් මානසික අසහනකාරී බවක් ඇතිකරයි. නිතර තමා සොයාගෙන එන කෙනකු නිසා ඇතිවන මතභේදයක් දුර දිග යාමට ඉඩ ඇත. ණය ගනුදෙනුවකින් නිදහස් වීමට අවස්ථාව උදාකරයි. සතිය මැද කාලය වන විටදී යටපත් වූ සෙම් රෝගයක් නැවත මතු වන ලකුණු පෙන්නුම් කරයි. සති අන්තය වන විටදී අලුත් ගේ දොර ඉදිකිරීමක් හෝ අලුත්වැඩියාවක් පිළිබඳ බලාපොරොත්තුවක් ඉටු කරයි. දරුවකු පිළිබඳ අලුත් බලාපොරොත්තුවක් ඇති කරන සතියකි.

**අය 06 - වැය 04** | **ජය වර්ණය - කහ**
**ජය අංකය - 09** | **සුබ දවස - බ්‍රහස්පතින්ද**

## සිංහ — හදිසි මුදලක් වැය වේ

වෙනදාට වඩා පින් දහම් කටයුතු කෙරෙහි වැඩි නැඹුරුතාවයක් ඇති කරමින් සතිය ආරම්භ කරන සිංහ ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා මේ සතියේ ගමන් කරන්නේ 9,10,11,12 යන භාවස්ථාන වලයි. වෙනදාට වඩා ශාරීරික වෙහෙසීම් ඇති කරන සතියකි. මවගේ අසනීප තත්වයක් වෙනුවෙන් කාලයත් ශ්‍රමයත් වැය කිරීමට සිදුවන සතියකි.

නිතර අන් අයගේ උපදෙස් පැතීමෙන් ගැටලුදායක බවකට මුහුණ පෑමට සිදුවෙයි. වෙනදාට වඩාවැඩි වෙහෙසක් ගෙන දෙන සතියකි. සතිය මැද කාලයේදී හදිසි මුදලක් වැය වන අන්දමේ කටයුත්තක් යෙදෙන බවක් පෙන්නුම් කරයි.

**අය 05 - වැය 06** | **ජය වර්ණය - දම්**
**ජය අංකය - 07** | **සුබ දවස - සිකුරාද**

## ධනු — හදිසි ලැබීමකට ඉඩකඩ

මෙතෙක් ගෙන තිබූ වැඩ පිළිවෙළක් වෙනසකට ලක් කරමින් සතිය ආරම්භ වන ධනු ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 5,6,7,8 යන භාවස්ථාන වලයි. වෙනදාට වඩා ගෘහ ජීවිතයේ කටයුතු පිළිබඳ කල්පනාකාරී විය යුතු බවක් පෙන්නුම් කරයි. අයුතු යෝජනාවලට ලක්විය හැකි කාලයක් බැවින් එකිනෙකා ඇසුරේදී කල්පනාකාරී වන්න. පවුලේ කෙනකුගේ උසස් ජයග්‍රහණයක් නිසා සතුටු වීමට අවස්ථාව උදාකරයි. අඹුසැමි ගැටලුවක් දුර දිග යාහැකි බවක් පෙන්නුම් කරයි. තීන්දු තීරණ ගැනීමේදී දුර දිග සිතා බලන්න. හදිසි ලැබීමකට ද ඉඩ කඩ ඇති සතියකි.

**අය 07 - වැය 06** | **ජය වර්ණය - තැඹිලි**
**ජය අංකය - 09** | **සුබ දවස - සිකුරාද**

## වෘෂභ — නොකළ වරදකට අසහනය

අවිවේකී ලෙස උදාවන මේ සතියේ වෘෂභ ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 12,1,2,3 යන භාවස්ථාන වලයි. පවුලේ කෙනකු නිසා හදිසි වියදමක් දැරීමට සිදුවන බවක් පෙනේ. වෙනදාට වඩා යන එන ගමන් පිළිබඳ සැලකිලිමත් වන්න. එමෙන්ම තීන්දු තීරණ ගැනීමේදී වැඩිහිටි උපදෙස් පැතීම වැදගත් වේ.

නොකළ වරදක් හේතුවෙන් මානසික අසහනය ඇති කරයි. අමතර ලැබීම් පිළිබඳ වෙනදාට වඩා උනන්දුවක් මෙන්ම වෙහෙසීමක් ද ඇති කරන සතියකි. මවු පාර්ශ්වයේ සහෝදරයකු පිළිබඳ ඇති කර ගත් සිත් නොහොඳකමක් දුර දිග යාමට ඉඩ ඇත.

**අය 07 - වැය 06** | **ජය වර්ණය - ලා දම්**
**ජය අංකය - 04** | **සුබ දවස - සිකුරාද**

## කන්‍යා — රැකියාවේ ගැටලුවක් නිරවුල්

තමා සතු දෙයක් නැතිවීමට ඉඩ ඇති කාලයක් වන අතර මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 8,9,10,11 යන භාවස්ථාන වලයි. හිතුමතයට ගන්නා තීරණයක් හේතුවෙන් පවුලේ අයගේ නොසන්සුන්තාවයක් ඇති කරන කාලයක් වන අතර නිතර පවුලේ අයගෙන් දුරස්ව කටයුතු කිරීමටද සිදුවන බවක් පෙන්නුම් කරයි.

රැකියාවේ කටයුතු සම්බන්ධ මෙතෙක් පැවැති ගැටලුදායක බවක් නිරවුල් කර ගැනීමට හැකිවෙයි. සතිය මැද කාලයේදී දරුවකුගේ කටයුතු සම්බන්ධ තීරණ ගැනීමේදී දුර දිගසිතා බලන්න.

**අය 07 - වැය 06** | **ජය වර්ණය - කොළ**
**ජය අංකය - 09** | **සුබ දවස - ඉරිද**

## මකර — සහෝදර සිත් තැවුලක්

ගෘහ ජීවිතයේ කටයුතු සම්බන්ධ අවිවේකී බවක් ඇති කරමින් සතිය ආරම්භ වන මකර ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා මේ සතියේ ගමන් කරන්නේ 4,5,6,7 යන භාවස්ථාන වලයි. පවුලේ අයගේ කටයුතු සම්බන්ධ වෙනස්කම් කීපයක් සිදුකරයි. වැඩිමහල් දරුවකු සම්බන්ධව විමසිල්ලෙන් පසුවන්න. සතිය මැද කාලයේදී වාහනයක අඩුපාඩු කීපයක් සපුරා ගැනීමට අමතර මුදලක් වැය කිරීමට සිදුවේ. වෙනදාට වඩා කෑමෙන් බීමෙන් පරිස්සම් විය යුතු බවක් පෙනේ. සහෝදරයකු සමඟ ඇතිවන වචන හුවමාරුවක් හේතුවෙන් සිත්තැවුලකට පත් වීමට සිදුවේ. හදිසි වැටීම් තැලීම් වලට ඉඩ ඇති කාලයකි ඒ ගැන අවබෝධයෙන් කටයුතු කරන්න.

**අය 07 - වැය 08** | **ජය වර්ණය - කහ**
**ජය අංකය - 04** | **සුබ දවස - සඳුද**

## මිථුන — උරහිස ආශ්‍රිත ආබාධයක්

හදිසි ලැබීමකට මඟ සැලසෙමින් සතිය ආරම්භ කරන මිථුන ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 11,12,1,2 යන භාවස්ථානවලයි. වෙනදාට වඩා අතමිට මුදල් හිමිවන අන්දමේ කටයුතු කීපයක් යෙදෙන සතියකි. පොරොන්දු ගිවිසුමක් සාර්ථක වීමෙන් පැවැති ගැටලු කීපයකින් නිදහස් වීමට අවස්ථාව උදාකරයි. එහෙත් හිතුවක්කාර තීරණයක් තමාට අවාසිදායක තත්ත්වයක් ඇති කරයි. සතිය මැද කාලයේදී නිතර ඇති කරන උරහිස ආශ්‍රිත ආබාධ තත්වයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ. අලුත් බලාපොරොත්තු ඇති වුවත් ඒවා එතරම් දුරට සාර්ථක නොවන බවක් පෙන්නුම් කරයි.

**අය 06 - වැය 05** | **ජය වර්ණය - කොළ**
**ජය අංකය - 02** | **සුබ දවස - බදාදා**

## තුලා — විවාහ යෝජනාවක්

පොරොන්දු ගිවිසුමකට කටයුතු සැලසෙමින් සතිය ආරම්භ වන තුලා ලග්න හිමි ඔබගේ සඳු ගේ ගමන සිදුවන්නේ 7,8,9,10 යන භාවස්ථානවලයි. හදිසි තීරණයක් නිසා ඇතිව තිබූ මතභේදකාරී බවක් සමථයකට පත් වන ලකුණු පෙන්නුම් කරයි. නිතර නිවසින් පිට වාසයට කරුණු සැලසෙන බවක් පෙන්වයි. යටපත් වූ විවාහ යෝජනාවක් නැවත අලුත් වන කාලයකි. ගේ දොර කටයුතු සම්බන්ධ පැවැති සුළු සුළු අඩුපාඩු කීපයක් සපුරා ගැනීමට අවස්ථාව සැලසේ. එහෙත් ළඟින් ඇසුරු කරන අයකු සමඟ සිදුවන සිත් නොහොඳකමක් දුරදිග යන අන්දමේ කරුණු කීපයක් උදා කරයි.

**අය 06 - වැය 05** | **ජය වර්ණය - තැඹිලි**
**ජය අංකය - 02** | **සුබ දවස - බ්‍රහස්පතින්ද**

## කුම්භ — පවුලේ උත්සව අවස්ථාවක්

වෙනදාට වඩා ඇවිදිලි ඇති කරමින් සතිය ආරම්භ වන කුම්භ ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා මේ සතියේ ගමන් කරන්නේ 3,4,5,6 යන භාවස්ථාන වලයි. යන එන ගමන් පිළිබඳ වෙනදාට වඩා සැලකිලිමත් වෙමින් පවතින සතියක් වන අතර ගෘහ ජීවිතයේ කටයුතු පිළිබඳ වෙහෙසීමක් කළ යුතු බවක් පෙනේ. නිතර ගේ දොර අලංකාරය පිළිබඳ කටයුතු වල නියැලෙස කාලයකි. එමෙන්ම පවුලේ උත්සව අවස්ථාවකට ද කටයුතු සැලසෙන බවක් පෙන්නුම් කරයි. අලුත් නෑදෑ හිතවතුන් දැන හඳුනා ගැනීමට මග සැලසෙන බවක් පෙනේ. අමතර මුදල් වියදම් යෙදෙන කාලයක් බැවින් ගනුදෙනු පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන්න.

**අය 07 - වැය 08** | **ජය වර්ණය - කොළ**
**ජය අංකය - 06** | **සුබ දවස - බ්‍රහස්පතින්ද**

## කටක — ගුප්ත කටයුතුවලින් පිහිට

රැකියාවේ කටයුතු සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේදී දුර දිග සිතා බැලිය යුතු සතියක් වන අතර මේ සතියේ ඔබේ ලග්නයේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 10,11,12,1 යන භාවස්ථාන වලයි. අලුත් රැකියා අපේක්ෂිතයන්ට යහපත් කාලයක් වන අතර තනතුරු ලාභ අපේක්ෂාවෙන් සිටින අයට ද සුබදායක කාලයක් බව පෙන්නුම් කරයි. නිතර ආගමික සහන පතන කාලයක් වන අතර ගුප්ත කටයුතු වලින් ද පිහිට පතන බවක් පෙන්නුම් කරයි. සතිය මැද කාලයේදී සමාජයේ කැපීපෙනෙන අන්දමේ කටයුතු කීපයක් සිදුවීමට ඉඩ ඇති අතර ප්‍රභූ අය හා ඇසුරට ද අවස්ථාව උදාකරයි. වෙනදාට වඩා කල්පනාකාරී විය යුතු සතියකි.

**අය 06 - වැය 05** | **ජය වර්ණය - කොළ**
**ජය අංකය - 04** | **සුබ දවස - සඳුද**

## වෘශ්චික — දරුවකුගේ ජයග්‍රහණයක්

වරින් වර ශාරීරික වෙහෙස මහන්සිය සිදු කරමින් සතිය ආරම්භවන වෘශ්චික ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා මේ සතියේ ගමන් කරන්නේ 6,7,8,9 යන භාවස්ථාන වලයි. පවුලේ වැඩිමහල් දරුවකු සම්බන්ධ ඇතිව තිබූ ගැටලුවක් නිරවුල් කර ගැනීමට මඟසැලසෙන සතියකි. සතිය මැද කාලය වන විටදී වරින් වර ඇතිවන උගුර ආශ්‍රිත අබාධයක් හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ.

වාහන ගමන් පිළිබඳ කල්පනාකාරී විය යුතු කාලයකි. සති අන්තය වන විටදී දරුවකුගේ උසස් ජයග්‍රහණයක් පිළිබඳ සතුටට පත් විය හැකි අන්දමේ පුවතක් අසන්න ලැබේ.

**අය 08 - වැය 06** | **ජය වර්ණය - ලා දම්**
**ජය අංකය - 04** | **සුබ දවස - බදාදා**

## මීන — තැන්පත් ධනය වැය වීමක්

ලැබීම් අතින් යහපත් සතියක් වන අතර මේ සතියේ මීන ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 2,3,4,5 යන භාවස්ථාන වලයි. විදෙස් ගත ඥාතියකුගෙන් උපකාරයක් හිමිකරන කාලයකි. වෙනදාට වඩා අතමිට මුදල් ගැවසෙන බවක් පෙන්නුම් කරයි.

සතිය මැද කාලය වන විටදී ආගමික සැලසුමක් වෙනුවෙන් වෙහෙසීම් ඇති කරයි. නොසිතූ ලෙස තැන්පත් ධනය වැය වන අන්දමේ කටයුතු කීපයක් යෙදෙන බවක් පෙනේ. සති අන්තයේදී දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු වල සැලසුම් කීපයක් වෙනස් කිරීමට සිදුවෙයි. විදෙස් ගමනක් පිළිබඳ තීරණයකට මග සැලසේ.

**අය 07 - වැය 06** | **ජය වර්ණය - ලා දම්**
**ජය අංකය - 05** | **සුබ දවස - සිකුරාද**



# මානසික පීඩනයෙන් මිදෙන්න සති යෝග

සොබාදහම දේවත්වයෙන් ඇදහූ ආදි මුතුන්මිත්තන් ජීවන සටනේ කටුක හා දුක්බර අත්දැකීම් තුළ විඳි දැඩි මානසික පීඩනයෙන් යම් තරමකට හෝ නිදහස් වූයේ වත්මන් නිමේෂයේ තම සිත දෙවියන්ගේ පාමුල සමාධිගත කිරීමෙනි. ඉෂ්ට දේවතානුස්මරණය නමින් වහරට ආවේ එයයි. එය අද මෙන් එදා නමින් පමණක් කරන හුදු චාරිත්‍රයක් නොවිනි. සැබෑම මානසික අත්දැකීමකි.

වනාත පාහින දවසේ සිට වී ටික ගෙට ගන්නා තෙක්ම අත්විඳි දුක් කම්කටොලුවලට වේදනාව දරාගෙන වත්මන් සිතට ගලා එන අතීත මතක විසින් වේදනාබර අසහනකාරී බවක් ඇතිකිරීම ස්වභාවයකි. සියල්ල මොහොතකට අමතකකොට අවුරුදු චාරිත්‍රවලට අනුගතව ප්‍රමෝදමත් සිතින් ගෙවන අවුරුදු උලෙළත් සමඟම එදා මිනිසාගේ මනසේ පිරී අසහනකාරිවූ මනෝධර්මයන් ඉවත්වන්නට ඇත.

මේ සන්සිද්ධියම වෙනත් දියුණු ආකාරයකට අනුගමනය කොට යෝගීහු චිත්ත සමාධියෙහි පිහිටා විශ්ව යථාර්ථයක් ප්‍රත්‍යක්ෂ කළෝය. එමඟින් ආධ්‍යාත්මය පිළිබඳ එක්තරා නියමයක් ලොවට ඉදිරිපත් කළෝය. එනම් "එළවාගත් සිහියෙන් සිත වත්මන් සංජානනය මත රඳවාගත්විට නොසන්සුන් අතීතයෙන් මනස අතමිදේ' යන්නයි.

බෞද්ධ ත්‍රිපිටක පාලියේ මජ්ඣිමනිකායේ අන්තර්ගත මහා සතිපට්ඨාන සූත්‍රය ආදි එවැනිම තවත් සූත්‍ර ධර්මයන්හි මේ පිළිබඳ විස්තර අන්තර්ගතය. පතඤ්ජලි යෝග සූත්‍ර වැනි පශ්චාත් වෛදික ඉගැන්වීම්වලද මීට සමාන ඉගැන්වීම් දක්නට ලැබේ.

එළඹගත් සිහියෙන් යුතුව ජීවිතය ගතකරන තැනැත්තා ජීවිතය ජයගන්නා බව මේ අනුව අපට සිතාගන්නට හැකිය.

වත්මන් සමාජයේ වැඩිහිටියන් මෙන්ම පාසැල් දරුවන්ද දැඩි අසහනකාරී බවකින් පෙළෙනු පෙනේ. පාසැලට යන දරුවාට ගුරුවරයා උගන්වන පාඩම පැහැදිලි නැත. දැනුමේ අඩුව පුරවාගන්න පොත් පාඩම් කරන්න ගත්තත් අකුරු සහ රූ සටහන් තුළ අන්තර්ගතය දරුවාගේ බුද්ධියට එකතු නොවෙයි. තව තවත් උත්සාහ කිරීමේදී මොළය සහ දෑස විඩාබර වීමෙන් නිදිමත ක්ලාන්ත ගතිය ඇතිවේ. ළඟ එන විභාගයට ළමයා මුහුණදෙන්නේ කෙසේද? විභාග භීතිකාව තව පැත්තකින් මනස පීඩා කරයි. මේ සියල්ල තුළ දුක්විඳින දරුවා ඉගෙනීමේ වැඩවල යෙදෙන්න දෙමව්පියෝ බල කරති. දරුවා තවත් වේදනාවට පත් වෙයි. මෙබඳු මානසික තත්ත්වයකින් පීඩිත දරුවකුට තම පීඩිත මනස ඉවත්කොට සහනදායි මානසික ස්වභාවයකට ඒම අත්‍යවශ්‍ය වෙයි.

එළඹගත් සිහියෙන් යුතුව ජීවිතය ගතකරන තැනැත්තා ජීවිතය ජයගන්නා බව මේ අනුව අපට සිතා ගන්නට හැකිය.

පීඩාකාරී මානසික තත්ත්වයක් ඉවත් කළ හැකි එක් මගක් තමයි "සතිය" පුරුදු කිරීම. සතිය යනු එළඹගත් සිහියයි. එය පුරුදු කරන්නේ කෙසේද?

පවුලේ සියලුදෙනා ගේ මැද සාලේ හෝ එළිමහනේ රුක් සෙවණක හෝ වාඩිවෙන්න. හරියට සමාධි පිළිවෙත ඉරියව්වට සමාන ඉරියව්වක වාඩි වී දෑත් දෙදණ මත උඩුකුරුව තබාගෙන අත්වල මාපටැඟිල්ල තර්ජනී ඇඟිල්ලේ අග ගෑවෙන ලෙස තබාගන්න.

පවුලේ සියලුදෙනා ගේ මැද සාලේ හෝ එළිමහනේ රුක් සෙවණක හෝ වාඩිවෙන්න. හරියට සමාධි පිළිවෙත ඉරියව්වට සමාන ඉරියව්වක වාඩි වී දෑත් දෙදණ මත උඩුකුරුව තබාගෙන අත්වල මාපටැඟිල්ල තර්ජනී ඇඟිල්ලේ අග ගෑවෙන ලෙස තබාගන්න.

දැන් හුස්මක් ගෙන සැහැල්ලුවෙන් පිටකර නිසල වන්න. දැන් ඔබේ සිත ඔබ ළඟට ගන්න. හොඳින් සිහිය පවත්වාගන්න. මේ දැන් සිදුවන දේ ගැන මේ දැන් ඔබේ සිතට දැනෙන දේ ගැන ඔබ වාඩි වී සිටින සැටි දැනෙනවා. පොළොව මත සිරුර ස්පර්ශවන සැටි දැනෙනවා. දෑත, දෙපය, පිහිටා ඇති අයුරු සිතට දැනෙනවා. සිරුර කෙළින් සැහැල්ලුව තිබෙන සැටි දැනෙනවා.

ඔබ ඔබේ සිත සමඟ එකතුවන්න. ඔබත් සිතත් එකම වෙලාවකදී එකම දේ කරන්න. ඇහුම්කන් දෙන්න. අවටින් ඇසෙන ශබ්දවලට. සිතත් සමඟම හොඳින් අසා සිටින්න. විනාඩි පහක් පමණ සිතට යන්න දෙන්න එපා ඔබෙන් ඉවතට. සිත සමඟ යාළුවෙලා ඉන්න.

දැන් සිත ළංකරගන්න ඔබේ සිරුරට. සිතට දැනෙනවා ආශ්වාස ප්‍රශ්වාස කරන සිරුරේ චලනයන්. සිරුර පිම්බෙනවා. හැකිළෙනවා. ඔබට දැනෙනවා ස්පර්ශයෙන් සිරුරේ තවත් පුංචි පුංචි වේදනා දැනෙනවා තැන තැන. ඒ හැම එකක්ම සිතින් බලන්න. සිතින් විඳින්න. විනාඩි පහක් විතර.

දැන් ඔබ වඳින විදිහට දෑත් එක්කොට පපුව මට්ටමේ තබා ගන්න. සිතට දැනෙනවා අත්ලෙන් අත්ල ගැටී ඇති සැටි අල්ල ඇඟිලි එකිනෙකාට ගැටෙනවා. ස්පර්ශයෙන් දැනෙනවා.

දැන් අත්ලෙන් අත්ල පිසදමන ආකාරයට එහාට මෙහාට චලනය කරමින් අත්ලෙන් අත්ල ගැටෙන ස්පර්ශය සිතින් විඳින්න. එක් අතතින් අනික් අතේ ඇඟිලි වෙන වෙනම පිරිමදිමින් දැනෙන ස්පර්ශය සිතින් විඳින්න.

දැන් ඔබ ඔබේ සිතත් සමඟම එකතුවෙලා නැගිටින්න. නැගිටිනවිට දැනෙන කායික වේදනා හොඳින් බලන්න සිතින්.

සක්මන අරඹන්න. පාදයක් ඔසවා පොළොවේ තබන්න. පාදය පොළොවේ ගැටෙන සැටි ස්පර්ශයෙන් විඳින්න. මෙසේ හැකි වේලාවක් භාවනාවේ යෙදෙන්න.

ප්‍රතිඵල අත්විඳින්න. පීඩනය මනසින් පලා ගොස් ඇති බව මෙනෙහි කර බලන්න.



කේ. මහතුන් ගමගේ

# විවාහ සහකරු සහකාරිය කොහොම වේද?

කෙනෙක් උපදින අවස්ථාවේ පිහිටි ග්‍රහයින්ගේ තත්ත්වයත්, එම ග්‍රහයින් තැන්පත්ව පිහිටි ස්ථානයත්, ඔවුන්ගේ බල දුබලතාවන්, ග්‍රහ දෘෂ්ටි හා ග්‍රහ සංයෝගයන් අනුව තමන්ට හිමිවන සහකරුගේ හෝ සහකාරියගේ ස්වභාවයත් ජ්‍යෝතිෂයේ විවිධ ආකාරයෙන් සඳහන් කර ඇත. ජ්‍යෝතිෂය අනුව විවාහයක් ඉක්මන් කරන්නේ කුජ ග්‍රහයාත්, සිකුරු ග්‍රහයාත් යන දෙදෙනාය.

විවාහයක් වාසනාවන්ත එකක් කරන්නේ ගුරු ග්‍රහයාත්, චන්ද්‍රයාත් දෙදෙනායි. විවාහයක් ප්‍රමාද කරන්නේ ශනි හෙවත් සෙනසුරු ග්‍රහයාත් කේතු ග්‍රහයාත්ය. රවි ග්‍රහයාත්,රාහු ග්‍රහයාත් යන දෙදෙනා වැඩි බලය ඇති පැත්තට සහාය දක්වයි. බුධ ග්‍රහයා මධ්‍යස්ථභාවයක් දක්වයි. විවාහය පිළිබඳව සලකා බැලීමේදී කේන්ද්‍රයේ හත්වැන්නත්, හත්වැන්නේ ත්‍රිකෝණ ස්ථානවූ තුන්වැන්නේත් එකොළොස් වැන්නත් පරීක්ෂා කළ යුතු අතර, කේන්ද්‍රයේ දෙවැන්න හා අටවැන්නද මේ සඳහා බලපෑමක් කරයි.

## ගුරු උච්ච වීම

යම් අයෙකුගේ කේන්ද්‍රයේ හත්වැන්නේ ගුරු උච්චව බලවත්ව පිහිටියේ නම් එම අයගේ විවාහ ජීවිතය ඉතා වාසනාවන්ත වෙයි. කාන්තාවක් නම් ඇය සෑහෙන තරම් මිල මුදල් දේපළ හිමි ඇත්තියක් වේ. තම ස්වාමි පුරුෂයාට ද කීකරුව ඔහුගේ අවශ්‍යතා සොයා බලා අවශ්‍යතාවන් සපුරාලන තැනැත්තියක් වෙයි. පුරුෂයෙකු නම් තම බිරිඳට ආදරයෙන් සෙනෙහසින් සලකන ඇයගේ සියලු අඩුපාඩුකම් සපුරාලන අයෙක් වෙයි. ගුණ යහපත් කමින්ද පිරිපුන් අයෙක්ද වේ. මේ නිසා යහපත් යුග දිවියකට සාර්ථක විවාහයකට එබඳු ග්‍රහ පිහිටීම් වැදගත් වෙයි.

## දෙවැන්න හා හත්වැන්න

සිකුරු, බුධ, ගුරු ආදී සෞම්‍ය ග්‍රහයෝ පළමුවැන්න, හතරවැන්න, හත්වැන්න දහවැන්න ආදී කේන්ද්‍රස්ථානයක පිහිටි දෙවැන්න හා හත්වැන්න අධිපති ග්‍රහයෝ ස්වක්ෂේත්‍රව පිහිටා ඇති කේන්ද්‍ර හිමියෝද ඉතා වාසනාවන්ත යුගදිවි ගත කරන්නෝ වෙති. අන්‍යෝන්‍ය දැඩි බැඳීමෙන් හා දැඩි ආදරයෙන් යුතුව ඔවුහු සැමදා යුගදිවි ගත කරති. මිල මුදල්සේම ගේ දොර ඉඩකඩම් ආදියෙන්ද අඩුවක් නැත්තේ වෙයි. යහපත් දූ පුතුන්ද ලැබ සැමදා සතුටින් ගත කරති.

## සත්වැන්න අධිපති දොළොස්වැන්නේ පිහිටීම

කේන්ද්‍රයේ සත්වැන්න අධිපති ග්‍රහයා පාප ග්‍රහයින් සමඟ සංයෝගව දොළොස්වැන්නේ සිටියහොත් එබදු අය ක්ෂණික කෝපයට පත්වන්නෝ වෙති. මෙම අයගේ විවාහ ජීවිතය අවුල් වියවුල්වලින් පිරුණු එකක් වෙයි. නැති වැරදි හදාගන්නා ඔවුන් සුළු දෙයකට පවා තදින් කෝප සහගත වේ. කුජ ග්‍රහයාත්, බුධ ග්‍රහයාත්, බ්‍රහස්පති ග්‍රහයාත්, චන්ද්‍රයාත් සංයෝගව යම් කාන්තාවකගේ කේන්ද්‍රයේ හත්වැන්නේ හෝ කටක රාශියේ යෙදී ඇත්නම් එබඳු කේන්ද්‍ර හිමි කාන්තාවන් ඉතා රූමත් අය වෙති. දුටුවන් වශීකරන රූ සපුවකින් යුක්ත වේ.

## ශුභ දෘෂ්ටියක්

යම් ස්ත්‍රියකගේ හත්වැන්නේ එක ශුභ ග්‍රහයකුගෙන් යුක්තව හෝ එක ශුභයෙකුගේ දෘෂ්ටි ලැබ තිබේනම් ස්වාමියාට ප්‍රිය වේ. ශුභයන් දෙදෙනෙකුගෙන් යුක්තව හෝ දෙදෙනෙකුගේ දෘෂ්ටි ලැබ තිබේනම් ඇය ආචාර සම්පන්න වේ. ශුභයින් තිදෙනකුගෙන් යුක්තව හෝ තිදෙනකුගේ දෘෂ්ටි ලැබ තිබේ නම් ඉතා යහපත් උසස් තැනැත්තියක් වේ. එක පාපියෙකුගෙන් යුක්තව හෝ දෘෂ්ටිය ලැබ තිබේ නම් ඇය අන් පුරුෂයන් දෙස බලන තැනැත්තියක් වේ. පාපයන් දෙදෙනකුගෙන් යුක්තව හෝ පාපයින් දෙදෙනකුගේ දෘෂ්ටි ලැබ තිබේ නම් ඇය ආචාර සම්පන්න නොවේ. පාපයින් තිදෙනකුගෙන් යුක්තව හෝ තිදෙනකුගේ දෘෂ්ටි ලැබ තිබේ නම් ඉතා අයහපත් වේ.

## සිකුරු උච්ච වීම

සිකුරු උච්චව හතේ සිටියදී උපන් තැනැත්තිය නච්ච ගීතවාදියට ප්‍රියවූ යහපත් පෙනීමෙන් යුත් සියලු ආභරණ වස්ත්‍රාදියෙන් යුත් ස්වාමිපුරුෂයා ප්‍රීතියෙන් පිනවන තැනැත්තියක් වන්නීය. ස්වාමිපුරුෂයාද එවැනිම අයෙක් වෙයි. ගුරු, සිකුරු දෙදෙනාගෙන් කෙනෙක් ලග්නය දැක සිටියදී බුධහු උච්චව අඟහරු මකරයේත් සඳු කටකයේත් සිටි කල උපන් තැනැත්ති රූප සම්පත්තියෙන් අනූන ගුණවත් බලවත් රජ බිසවක් හා සමාන සැප විඳින්නියක් වේ. ඉතා උසස් විවාහයක් වෙයි.

## කුජ සහ සඳු

කුජ, සඳු දෙදෙනා පමණක් එකට සිටීම ස්ත්‍රී කේන්ද්‍රයක අශුභ යෝගයක් ලෙස ජ්‍යොතිෂයේ පෙන්වා ඇත. විශේෂයෙන් දුෂ්ට ස්ථානයක නම් එම නිවසින් ශ්‍රියාව බැහැරවන බව කියා ඇත. පුරුෂ කේන්ද්‍රයක වුවත් කුජ, චන්ද්‍ර යෝගය පාප ක්‍රියා කිරීමටත් ඒ සඳහා මුදල් නාස්ති කිරීමටත් හේතු වේ. රවි හතේ සිටීමද ස්ත්‍රී කේන්ද්‍රයක අශුභ පිහිටීමකි. ස්වාමි භක්තිය අඩුකරන දෙදෙනා අතර, අසමගියට ද හේතු වේ.

## ත්‍රිංශාංශකය

මේෂ, වෘශ්චික, දෙකින් එක ලග්නයට මේෂ, වෘශ්චික දෙකින් එකක චන්ද්‍රයාත් සිටියදී ලග්නයේ උදාවන ත්‍රිංශාංශකය අඟහරුගේම වුවොත් එකල උපන් තැනැත්ති ඉතා තද පරුෂ නපුරු ස්ත්‍රියක් වෙයි. ශනිගේ ත්‍රිංශාංශකය වුවහොත් පහත් ක්‍රියා කරන්නියක වෙයි. ගුරුගේ ත්‍රිංශාංශකය වුවහොත් ඉතා යහපත් වේ. සිකුරුගේ ත්‍රිංශාංශකය වුවහොත් කාමචේතනා අධික තැනැත්තියක් වේ.

ධනු, මීන දෙකින් එකක් ලග්නයට චන්ද්‍රයාත් ධනු, මීන දෙකින් එකක සිටියදී ලග්නයේ උදාවන ත්‍රිශාංශකය ගුරුගේ නම් ගුණ නුවණින් යුක්ත ඉතා යහපත් තැනැත්තියක් වේ.



යම් අයෙකුගේ කේන්ද්‍රයේ හත්වැන්නේ ගුරු උච්චව බලවත්ව පිහිටියේ නම් එම අයගේ විවාහ ජීවිතය ඉතා වාසනාවන්ත වෙයි. කාන්තාවක් නම් ඇය සෑහෙන තරම් මිල මුදල් දේපල හිමි ඇත්තියක් වේ.

හිඹුටානේ
**පියතිලක ද අල්විස්**

# රෝගාබාධ රැසකට ගුණදෙන තිත්ත ලබු

**රෝගබාධ රාශියකට ගුණ දෙන ඖෂධ යෝග රාශියක් සඳහා උපයෝගී කර ගනු ලබන ද්‍රව්‍යයක් වශයෙන් තීත්ත ලබු හැඳින්විය හැකිය. ලබු විශේෂ කිහිපයක් වන අතර, ඒ අතුරින් තිත්ත ලබු එක් විශේෂයක් ලෙස හැඳින්විය හැකිය.**

## වැවෙන ප්‍රදේශ

**විදේශිය වශයෙන්**

ඉන්දියාවේ සියලුම ප්‍රදේශවල වැවෙන ලතාවකි.

**දේශිය වශයෙන්**

ශ්‍රී ලංකාවේද සියලු ප්‍රදේශවල පාහේ දැකිය හැකි ලතාවකි.

## තීත්ත ලබු පිළිබඳව විවිධ භාෂාවලින් හඳුන්වන නාම

**පොදු සිංහල නාමය**

තීත්ත ලබු වෙයි. මෙහි ලබු යනු අලාබු යන්නෙන් බිඳී ආවෙකි. මෙහිදි තික්ත රසය ඇති වර්ගය තිත්ත ලබු වශයෙන් හඳුන්වයි.

**සංස්කෘතික බසින්**

ඉක්ෂ්වාකු, කටුතුම්බී, මහාඵලා, තික්තාලුබු, කුම්බී, පිණ්ඩඵලා, කටුකාලාබු, තික්තේක්ෂ්වාතු ආදි නාමයන් යෙදේ. මේ අතුරින්

මහාඵලා - ලොකු ගෙඩි ඇති වර්ගය

පිණ්ඩඵලා - වටකුරු ගෙඩි ඇති වර්ගය යනුවෙන් හඳුන්වයි.

**හින්දි බසින්**

කිති ලෞකී කවුවාලෞකී යනුවෙන් ද

**වංග බසින්**

තිත්ලාඋ යනුවෙන් ද

**ඉංග්‍රීසි බසින්** Bitter Apple සහ Bitter Gourd යනුවෙන් යෙදේ.

**තිත්ත ලබුවල උද්භිද විද්‍යාත්මක නාම–**

Lagenaria siceraria standle සහ Coc cynthis vƒ lgarig schrad වන අතර

**කුලය –**

Cucurbitaceae හෙවත් කෝශාතකී කුලය වේ.

මෙම කෝශාතකී කුලයට අයත් අනෙකුත් ඖෂධීය තුරුලතා අතර පුහුල්, කෝවක්කා, ගොන්කැකරී, කැකිරී, දියලබු, තික්ත වැටකොලු, දේවදුලී කරවිල, තුඹ කරවිල, හොඩල, දුම්මැල්ල සහ වැල් රසකිඳ ආදි වශයෙන් විශාල ප්‍රමාණයක් වේ.

**තිත්තක ලබු ප්‍රභේද**

1. කටුතුම්බි - තිත්ත ලබු
2. දියලබු වශයෙන් ප්‍රභේද 2 කි.

තිත්ත ලබු ස්වරූපය

මෙය හැඩහුරුකමින් දියලබු හා සමානකම් දක්වයි.

**තිත්ත ලබුවල ඖෂධීය අංග**

ගෙඩි කොළ සහ ඇට ආදියයි.

තිත්ත ලබුවල අඩංගු රසානික උපාද්‍රන අමු ගෙඩියේ 90.36% න් ජලයද වියළි ගෙඩියේ සැපොනින් (Saponin) ඊතර් එක්ස්ට්‍රැක්ට් සහ ඇල්බුයුමිනොයිඩ් ආදියද අන්තර්ගතය.

**ඖෂධීය වටිනාකම**

තිත්තක ලබු ඖෂධීය වශයෙන් ඉතා ඈත අතීතයේ සිටම ප්‍රයෝජනයට ගනු ලැබූ බව මූලික සංහිතා ග්‍රන්ථ පරීශීලනයෙන් පැහැදිලි වේ.

එනම් චරක සංහිතාවේ සූත්‍ර ස්ථානයේ සහ චිකිත්සා ස්ථානයේද සුශ්‍රැත සංහිතාවේ සූත්‍ර ස්ථානයේ සහ චිකිත්සා ස්ථානයේද අෂ්ටාංග හෘදය සංහිතාවේ. සූත්‍ර ස්ථානයේ සහ උත්තර ස්ථානයේද තිත්ත ලබු ගැන විවිධ ගණ සහ යෝගවලට දක්වා තිබීමෙන් එය පැහැදිලි වේ.

තිත්ත ලබු

**රසයෙන්** තික්ත හා කටුක වන අතර

**ගුණයෙන්** ලඝු තීක්ෂණ සහ රූක්ෂ වේ.

**වීයඝියෙන්** ශීත වන අතර

**විපාකයෙන්** කටුක වේ.

**දෝෂ අනුව සැකසීමේදී**

සෙම් හා පිත් පිළිබඳව සංශෝධනය සහ සංශමනයද සිදු කරන අතර, විශේෂයෙන්ම සෙම් පිත්තජ රෝගවලදී යොදනු ලබයි.

**ශාරීරික ව්‍යුහාගත ක්‍රියා**

**බාහිර වශයෙන්**

තිත්ත ලබු ශිරෝ විරේචන, ජන්තුඝ්න, ශෝථහර(ඉදිමුම් නසන) ගුණවලින් යුතු අතර, තිත්ත ලබු බීජවල තෛව ව්‍රණ ශෝධන සහ කෘෂ්ඨඝ්න(කුෂ්ඨ නසන) ගුණවලින් යුතුය. මෙනිසා කාමාලාවේදී මෙන්ම සෙම දෝෂය නිසා හටගත් ශිරෝ රෝගයේදීත් නස්‍ය වශයෙන්ද දන්ත කෘමි ආබාධ (දත් පණුවන් කෑම) වලදී ගංඩූෂ වශයෙන් තිත්ත ලබු යූෂය යොදනු ලබයි.

එසේම මෙහි තෙල ඉදිමුම්, ග්‍රන්ථී, ගංඩමාල, ව්‍රණ, කුෂ්ඨ ආදි අවස්ථාවල ආලේපනයක් ලෙස ප්‍රයෝග කළ හැකිය

**අභ්‍යන්තර වශයෙන්**

**ආහාර පරිපවන ව්‍යුහාවේදී**

තියුණු වමන කාරක ගුණය සහ භේදන ගුණයෙන් යුතුය. මෙ නිසා වමනයෙන්, විරේචනයත් උදෙසා මෙහි මාංසය ඇට සහ කොළ යන තුන් වර්ගයම උපයෝගී කරගනු ලබයි. තවද කාස, ශ්වාස, විෂ වමන ජ්වර(උණ) මූර්ච්ජා ආදියේදී සහ සෙම හා පිත් කෝපයෙන් උපදින සෙසු රෝගවලදී ද සංශෝධනය උදෙසා මෙය උචිත පරිදි යොදනු ලබයි.

**රුධිර සංසරණ ව්‍යුහාවේදී**

ලේ පිරිසිදු කරන හා ඉදිමුම් නසන ගුණ යුතුය. එනිසා ලේ දුෂිත රෝග වලදී සහ ඉදිමුම් අවස්ථාවලදී මෙය යෙදිය හැක. ඉදිමුම්වලදී මෙහි මුල් ඉතා විශිෂ්ට ලෙස ක්‍රියා කරයි.

**ශ්වසන ව්‍යුහාවේදී**

තිත්ත ලබු සෙම් පිටකරන ගුණ යුතු අතර, කාස සහ ශ්වාස රෝග වලදී උපයෝගි කර ගනු ලබයි. මෙය යෙදුවිට ඉතා පහසුවෙන් සෙම බැහැර වෙයි. රෝගියා හට විවේකයක් ලැබුනාක් මෙන් තත්ත්වයක් ඇතිවේ.

**චර්ම ව්‍යුහාවේදී**

සමේදී කුෂ්ඨ නසන ගුණ යුතු නිසා සියලු කුෂ්ඨ රෝගවලදී මෙය යෙදීමෙන් ඉතා විශිෂ්ට ප්‍රතිඵල ළඟාකර ගත හැක.

මේ අතර, උණ නසන ගුණ යුතු නිසා සාමාන්‍ය උණේදී සහ සෙම් පිත්තජ උණේදි යොදනු ලබයි.

තවද විෂ නසන ගුණ යුතු නිසා වස විෂ කැවුණු විට සංශෝධනය සඳහා මෙන්ම විෂ වල ශක්තිය හා බලය නසනු සඳහා මෙන්ම විෂවල ශක්තිය හා බලය නසනු සඳහා ද මෙය යොදගනු ලබයි.

මේ ආදි ශාරීරික ව්‍යුහා ආශ්‍රිතව ඉතා හොඳින් ක්‍රියා කරන ද්‍රව්‍යයක් වශයෙන් තිත්ත ලබු හැඳින්විය හැක.

තිත්ත ලබුවල ඖෂධාංග අඩංගු ඖෂධ ප්‍රයෝග

**ආර්ශස් සඳහා**

තිත්ත ලබු සහ රෝමක ලුණු සම සමව ගෙන කාඩිවලින් අඹරා ඉන් ගුළි තුනක් සාදා තබා ගෙන පිට පිට දින තුනක් ගුද මාර්ගයේ ඇතුල් කර තැබීමෙන් අර්ශස් සුළු කලකින් සමනය වේ.

**අශ්මරී සඳහා**

1. තිත්ත ලබු ඇට චූර්ණය මී පැණියෙන් අනා බැටළු කිරි සමඟ සත් දිනක් ගැනීමද
2. තිත්ත ලබු යූෂයට සීනි සහ යවකර ලුණු දමා බීමද ඉතා ගුණදයකය.

**ගලගණ්ඩයට සඳහා**

පැසුණු තිත්ත ලබු ගෙඩියක් තුළට ජලය හෝ සුරා හෝ දමා සතියකින් පසු බීමට දීමෙන් ගලගණ්ඩය සමනය වේ.

**ප්‍රදර රෝගයට සහ දත් පණුවන් කෑමට**

තිත්ත ලබු ඇට සීනි සමඟ අනා මී පැණියෙන් අඹරා ගුළි සාදා කෑම ඉතා ගුණදයකය.

**නාසා අර්ශස් සඳහා**

තිත්ත ලබු මුලක් ඇල්දියෙන් අඹරා නස්න කිරීම ගුණදායකය.

**යෝනි රෝගයට**

1. තිත්ත ලබු කොළ හා ලොත් සුඹුළු සම සමව ගෙන අඹරා යෝනිය තුළ ගැල්වීමද ඉතා ගුණදායක.

**ඖෂධීය මාත්‍රා**

තිත්ත ලබු ස්වරසය කර්ෂ 1/2 -1 දක්වා

බීජ චූර්ණය රක්තිකා 6 - 18 දක්වා

මේ ආදි වශයෙන් තික්ත ලබු ඖෂධීය වශයෙන් අතිශයින් ප්‍රයෝජන ගෙන දෙනු ලබන ද්‍රව්‍යයක් වශයෙන් ප්‍රයෝජන ගෙන දෙනු ලබන ද්‍රව්‍යයක් වශයෙන් හැඳින්වීමට පුළුවන.

මේ අතර අභිගුණ්ඨිකයන් නයි නැටවීම සඳහා යොදාගනු ලබන නයිනලාව සාදා ගනු ලබන්නේද තික්ත ලබු කටුවලිනි.

මේ අනුව පැහැදිලි වන්නේ තිත්ත ලබු යනු ඖෂධීය වශයෙන් මෙන්ම තවත් බොහෝ ප්‍රයෝජන ගෙන දෙනු ලබන ද්‍රව්‍යයක් බවයි.

මෙ නිසා අපට ඉතා වැදගත් ඖෂධීය තුරුලතාවක් වශයෙන් තිත්ත ලබු හැඳින්විය හැකි අතර, මෙය සුදුසු අවස්ථාවල සුදුසු මාත්‍රාවකින් යෙදීමෙන් බොහෝ රෝගවලින් සමනය ළඟා කර ගත හැකි වේ.

මෙ නිසා මෙවන් අගනා ඖෂධ හොඳින් හඳුනාගෙන ඒවා ව්‍යාප්ත කිරීමෙන් සංරක්ෂණය කිරීමත් තුළින් මෙවන් ඖෂධ ආරක්ෂා කරගත හැකි අතර, එය රෝග නිවාරණයට ද බෙහෙවින් වැදගත් වේ.



පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්ය, වෛද්‍ය
මධුර පරණවිතාන

වෂී 2023 ක් වූ අප්‍රේල් 21 වැනිදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.